
# දළදා වරුණ


ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 පොසොන් මස 12 වන ගුරු දින ■ 2014 ජූනි මස 12 වැනි බ්‍රහස්පතින්දා



■ දළදා මාළිගාවෙන් නොමිලේ පිරිනමන දහම් පඩුරකි

■ විකිණීම සඳහා නොවේ



# මල්වතු මහානායක මාහිමිපාණන්වහන්සේ චිරං ජයතු...

**උන්වහන්සේගේ ජන්ම දිනය වෙසක් මස 30 වැනි දිනට යෙදී තිබිණ**



මහාවිහාරවංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මාහිමිපාණන් වහන්සේගේ ජන්ම දිනය රාජ්‍ය වර්ෂ 2014 වැන්නේ මැයි මස 30 වැනි දිනට යෙදී තිබිණ.

අප මහ නාහිමිපාණන් වහන්සේ, උපන් දින සැමරීම්වලට කැමැත්තක් නොදක්වන්නේ වී නමුත්, විශේෂයෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ හා සැදැහැවත් පින්වතුන් එක්ව ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි සුවඳතෙල් බුද්ධ පූජා පැවැත්වීමෙන් හා මහා සංඝරත්නය විෂයෙහි දානමානාදිය පිරිනැමීමෙන් ආයුරාරෝග්‍ය සම්පත්තිය හා දීඝායු පැතීම මෙවරත් නොකඩව කොට සිදුකෙරිණ.

මාතලේ දිගාවේ කොහොන්සිය පත්තුවේ "තිබ්බටුවාව" නම් සුන්දර ග්‍රාමයේදී ව්‍යවහාර වර්ෂ 1944 මැයි මස 30 වන දින ජන්ම ලාභය ලැබූ, අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ, කීර්ති ශ්‍රී රාජසිංහ මහරජු විසින් ප්‍රථම වරට මල්වතු මහාවිහාර පාර්ශවයේ මහාපදවියට පත් කොට වදාළ, අතිගරු තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිතාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේගේ සඟ පරපුරෙන් පැවත එන ප්‍රජනීය මහානාහිමිපාණන් වහන්සේ නමකි. ව්‍යවහාර වර්ෂ 1957න් වූ ජූනි මස 10 වන දින මහනුවර මල්වතු මහාවිහාරීය මංගල උපෝසථාගාරයේදී ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත්ව 1964 ජූනි මස 10 වැනි දින වාහල්කඩ නායකයන් උතුම් උපසම්පදා සම්පත්තිය ලැබූහ. ශ්‍රී දළදා මාලිගාවේ තේවා [illegible] කෙනෙකින් [illegible] භාර නාහිමිනමක් [illegible] කටයුතු කර [illegible] සම්ප්‍රදායානුකූල [illegible] වූහ. [illegible] කාරක සභිකයන් [illegible] සිදුව කළ [illegible] නාහිමිපාණන් [illegible] ජාතික [illegible] මල්වතු [illegible] පාර්ශවයේ [illegible] පත්ව [illegible] ශාසනික [illegible] වර්ෂ [illegible] ජූනි මස [illegible] දින මල්වතු [illegible] රාජපූජිත මංගල උපෝසථාගාරයේදී [illegible] අතිගරු [illegible] පත්ව වදාළහ.

රාජපූජිත මල්වතු මහා විහාරය [illegible] මහානායක පදවියේ ගෞරවය [illegible] කොට හොබවන වර්තමාන මල්වතු මහානාහිමිපාණන් වහන්සේ උපසම්පන්නාදී සංඝශෝභන ගුණයන්ගෙන් [illegible], ජාතික, ආගමික, සාමාජික [illegible] කටයුතු කෙරෙති. ස්වකීය ශිෂ්‍ය [illegible] වහන්සේ තුළ පමණක් නොව දිවයිනේ [illegible] භික්ෂූන් වහන්සේ අතරද ප්‍රසාදයට භාජන වූ [illegible] ප්‍රදානය, ශීලානෝපස්ථානය වැනි [illegible] නිරතුරුව යෙදෙන්නාවූ පරණ වෙති.

ඇවිදි සැරිය සීලසම්පන්න [illegible], අධිෂ්ඨාන, ආදර්ශ සම්පන්නව, ස්වකීය ඇවිදි ජීවිතය [illegible] සංසිද්ධියට කැප කොට ඇති, අප නාහිමිපාණන් වහන්සේට දීර්ඝායුෂ සම්පත්තිය හා නිරෝගී සම්පත්තිය නොඅඩුව ලැබේවායි දළඳ වරුණ ප්‍රාර්ථනා කරමි.

කේ. මීගහකුඹුර

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."

# මෙත් වැඩීමේ අනුහස්

සියලු ලෝ සතුන් වෙත මෙත් සිත් පතන්නා සෙමෙය ගති ඇත්තෙක් වේ. ඔහු සැමට ප්‍රිය වේ. සත් හැවිරිදි රාහුල කුමරුගේ බුදුරජාණන් වහන්සේගේ මුව දෙස බලා සුද බොළඳ බසින් 'සුඛතෙ සමණ, සුඛතෙ සමණ' යනුවෙන් 'මහණ ඔබ වහන්සේගේ සෙවණැල්ල ද මට සැපයයි' යනුවෙන් ප්‍රකාශ කළේ එහෙයිනි. එබැවින් සියලු ලෝ සතුන් වෙත මෙත් සිත පෑ යුතුය. මෛත්‍රිය පුරන්නෙකුට තරහකාරයෝ නොවෙති. 'අසවලා මට බැන්නේය, ගැසුවේය, නින්දා කළේ'යැයි මිනිසුන් ගැන සිතා වෛර කිරීම තම සිතට වේදනා ගෙන දෙන්නකි. එය සිතට බර පැටවීමක් වැනිය. වෛර සිතින් මිදීම කොතරම් යහපත්දැයි සිතනු මැනවි.

සිතින් මෙන්ම වචනයෙන්ද අනුන්ට හිංසා නොකළ යුතුය. තද වචන සමහර විට පිහි පාරකටත් වඩා දරුණුය. තමන්ට යමක් අමිහිරිනම් අනුන්ටත් එය එසේම අමිහිරිය. මුවින් පිටවන වචන තෙවැදෑරුමිය. 'මධුභාණී, පුෂ්පභාණී, ගූථභාණී' යනුයි. ඒ මී වැනි ප්‍රිය වචන කතා කරන්නේ මධුභාණී නම් වේ. මල් වැනි ලස්සන වචන කතා කරන්නේ පුෂ්පභාණී නම් වේ. අසූචි වැනි ගඳ ගහන වචන කතා කරන්නේ ගූථභාණී නම් වේ.

'ප්‍රිය වාචමේව භාෂෙය්‍ය - යා වාචා නින්දිතා
යං අනාදය පාපානි - පරේසං භාසතේ පියං'

වචනයක් ඇසුණු විට සතුට උපදවන්නේ එවැනි වචනයක්ම කිව යුතුය. අසන්නාගේ යහපතට හේතුවන වචන කතා කළ යුතුය. සිහිලු භාජනයෙහි දමන ගිනි පුපුරු වහා නිවී යන්නේය. එමෙන්ම මෘදු මොළොක් ප්‍රිය වචන කතා කිරීමට පුරුදුව සිටින්නෙකුට ඇතිවන ක්‍රෝධය වහා නිවී යන්නේය. රළු වචනය සිත දෙදරා යන කිණිසි පහරකි. බොරු කියා කේලාම් කියා පරුෂ වචන කියා වාද භේද ඇති කිරීමටත් අනුන්ට නින්දා කොට ඔවුන්ගේ චරිතය කිළුටු කිරීමත් හිංසාවකි.

ඇත්තක් වුවද කීමෙන් නපුරක් සිදුවේ නම් නොකියා ඉඳීම මැනවි. පිවිතුරු සත්‍ය වචනය වුවද අකාලයේ කතාව නොකීම අභිනතරය. අසෝබනය, මුවගට ආ තරමට වචන පිට නොකර දුරදිග බලා කල්පනාකාරීව මල් වැනි සුවඳැති වචනත්, මී වැනි රසැති වචනත් කතා කිරීමට පුරුදු විය යුතුය.

සිතිනුත්, වචනයෙනුත් යන දෙකටම වඩා හිංසාව සිදුවන්නේ ක්‍රියාවෙනි. එබැවින් හිඳීම් සතර ඉරියව්වම අනුන්ට හිංසාවක් නොවන පරිදි පැවැත්විය යුතුය. කිසිවෙකුටත් පැලීම් පෙලීම් ආදියෙන් කිසිවිටෙකත් හිංසා නොකරන්නට සිතාගත යුතුය. ගෙදර සිටින අසරණ මෙහෙකරුවෙට හිංසාව වෙනුවට ආදරය කරුණාව දක්වන්න. තමන්ට වඩා වැඩ නොගන්න පවුලේ අය මෙත් සිතා පිළිපදින්න. කුඩා දරුවාද අසරණ සතුන්ට ආදරයටවත් සෙල්ලමටවත් කරනෙන්වත් අතින් පයින් හෝ දඬු මුගුරු ආදියෙන් හිංසා නොකරන්න. සතුන් මැරීම, මැරවීමට අනුබල දීම, හිංසා කිරීම බලවත් පාපයකි. දහවත් තරුව ගැන ඔබ අසා ඇත. එය අලුයම කාලයෙහි අහසේ පායයි. සියලු තරු පරදවා පායන්නකි. මෙත් සිත් ඇති වූයේද දහවත් තරුව මෙන් බබලන්නේය. සරත් චන්ද්‍රයා සියලු තරු අභිබවා අහසේ බබලන්නේ යම් සේද මෙත් සිතැත්තෝද සදේවක ලෝකයා අතර ප්‍රිය මනාපව බබලයි. මෙත් වැඩීම සතුරන් මිතුරු කර ගැනීමට ප්‍රබල ආයුධයකි. පෙර පැලලුප් නුවර වැසි විශාඛ නම් එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් ලක්දිව බුදුසසුන බැබළෙන බව අසා අනුරාධපුර මහා විහාරයට පැමිණ පැවිදි විය. පසු කලෙක දේවියෙන් සෙත්වූ මාර්ගයකින් චිත්තලපව් විහාරයට වැඩ මෛත්‍රිය භාවනා වඩමින් හාර මසක් එහි වැඩ සිටියේය. දිනක් අලුයම අවදිව පැලලුප් නුවරට යෑමට සිතා සක්මනෙහි යෙදෙන්නේ 'මණිලියා' නම් දේවතාවෙක් උන්වහන්සේ වෙත පැමිණියේය. 'කොස් නවරන්නේදැයි' උන්වහන්සේ විමසූ විට 'ස්වාමීනි මම මණිලියා නම් දේවතාව වෙමි. ඔබ වහන්සේගේ මෙත් රාවය නිසා මේ ප්‍රදේශයේ අමනුෂ්‍යයන් ප්‍රීතියෙන් සුවපත් වී සිටිති. ඔබ වහන්සේ බැහැර වූයේ නම් යළිත් වාද භේද අඬ දබර හට ගැනෙයි. එබැවින් මෙහිම වැඩ සිටිය මැනවැයි' ආරාධනා කළේය. ඒ ආරාධනාව පිළිගෙන උන්වහන්සේ එහිම වැඩ සිටි සේක.

මෛත්‍රිය වඩන්නේ නම් අනුසස් බොහෝය. අප මහ බෝසතාණන් වහන්සේ මෙත් සිත පිරූ හැටි විස්මිත ජනකය. චුල්ල ධම්මපාල ජාතක කල්හි රජ කුමරෙක්ව ඉපිද සදරු වියෙහි සිටියදී පිය රජු කෝපාවිෂ්ටව සුදරු පුත් කුමරුගේ අත් පා කපා දමවයි, අනතුරුව ධම්මපාල කුමරු තමන්ම තමන් අමතා, 'මේ මෛත්‍රිය කිරීමට කාලයයි. ඔබ මරණයට පත් කරනු ලබන පියරජු කෙරෙහිද, ඔබගේ මරණයට හේතුවන මුදු මොළොක් සිතක් ඇති මෑණියන් කෙරෙහිද, මරණයට නියම වූ තමන් කෙරෙහිද මෛත්‍රිය පතුරවා, තමන් තමන්ටම අවවාද කොට මෙත් වැඩූ හැටි සිහිපත් කිරීම වටින්නේය.

මෛත්‍රී භාවනාව වඩන පින්වතුන් වෙසෙන ප්‍රදේශයෙහි සිටින කොටි දෙනුන් පයින් පිහිත මුව පැටවුන් තම දරුවන් යැයි සිතා ප්‍රේම කොට කිරි පොවති. අපි රජ්ජුරුවෙනේ වෙසෙන සිරුරැති [illegible] සතුරු වූ මොනර පිල් සෙවණට වැද සැතපෙති. මෙත් වඩන්නන්ගේ ආශ්‍රයෙන් [illegible] මෙබඳු [illegible] ලැබේ නම් අප හැමදෙනාම දිනපතා මෛත්‍රිය වැඩුවහොත් කෙබඳු අනුසස් ලැබේදැයි කල්පනා කිරීම යහපත්ය. මෛත්‍රිය වඩන තැනැත්තා සුවසේ නිදයි. සුවසේ අවදි වෙයි. නපුරු සිහින නොදකියි. මිනිසුන්ට ප්‍රිය වෙයි. දෙවියන්ගෙන් ආරක්ෂාව ලබයි. අහසේ බබලන ලස්සන චන්ද්‍රයා මෙන් මුහුණ පියකරු වෙයි. සිහි මුළා නොවී කළුරිය කරයි. මේ ආත්මයේදී රහත් නොවුවහොත් බ්‍රහ්ම ලෝකයෙහි උපදී. කරුණු මෙසේ බැවින් අප සියලුදෙනාම මෛත්‍රිය වැඩීමට උත්සාහ වෙමු.

පූජ්‍ය මැණික්හින්න රතනසාර හිමි



''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''

# මහින්දගමනයට පෙර මෙරට පැවැති ආගමික පසුබිම



බුද්ධ වර්ෂ 236 වැන්නෙහි මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන ධර්මදූතයන් වහන්සේලා ලක්දිවට පැමිණ බුදු සසුන පිහිටුවීමෙන් පසු ආගමික ප්‍රබෝධයක් ඇතිවූ බව පෙනේ. මෙයට ප්‍රධාන වශයෙන් මිහින්දාගමනයට පෙර පැවැති ආගමික පසුබිම හේතුවන්නට ඇත. අතීතයේ පටන් මිනිසා නම් තමන්ගේ බලාපොරොත්තු, ප්‍රාර්ථනා ඉටුකර ගැනීම පිණිසත්, විපත්ති කරදර ආදියෙන් මිදී ආරක්ෂාව සලසා ගැනීම සඳහාත් යම් යම් ඇදහිලි ක්‍රම අනුගමනය කර ඇති බව ඉතිහාසයෙහි සඳහන් වේ. අතීතයේ ඉන්දු ආර්යයෝද විටින් විට පැමිණෙද්දී ඔවුන් ඇදහූ ඇදහිලි ක්‍රමද ලංකාවට රැගෙන එන්නට ඇත. විජයාවතරණයට පෙර මෙම දිවයිනෙහි නාග, දේව ආදී ගෝත්‍රිකයන් වාසය කර තිබේ. එබැවින් ඔවුන් යකුන් මළවුන් නාගයන් දෙවියන් හා ගස් ගල් ආදියද අදහන්නට ඇත.

"මහාවංශ, දීපවංශ" ආදී වංශකතාවලත්, "සමන්තපාසාදිකා විනය අටුවාවෙහි" සඳහන් වන පරිදි එකල ලක්දිව යකුන්, නාගයන් ඇදහීම, රුක් දෙවියන් ඇදහීම, පරිබ්‍රාජක ආදීන්ගේ ආගම්, බ්‍රාහ්මණ ආගම්, ජෛන ආගම් පැවැති බව පිළිගත හැකිය.

## යකුන් හා නාගයන් ඇදහීම

බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවූ අවස්ථාවේ ලංකාවේ යකුන් සිටි බව සඳහන් වෙයි. එසේම විජයාවතරණය වන විටද ලංකාවේ සිටියේ යක්ෂයන් බව මහාවංශයේ සඳහන් වෙයි.

"න සන්ති මනුජා එත්ථ" යනුවෙන් මහාවංශයේ සඳහන් වන්නේ එකල ලංකාවේ මිනිසුන් නොසිටි බවය. මෙකල විසූ යක්ෂයන් අමනුෂ්‍ය කොටසක් නොව නොදියුණු මිනිස් කොටසක් බව සිතිය හැකිය.

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

එකල ඔවුන් යකුන්, මළවුන්, ප්‍රේතයන් ඇදහීම නිසා යක්ෂ නාමයෙන් හැඳින්වූහ.

පණ්ඩුකාභය රාජ්‍ය කාලය වන විටත් යකුන් පිදීම ලංකාව පුරාවලිතව පැවැති ඇදහිල්ලකි. උන්මාද චිත්‍රාවගේ දසයන් දෙදෙනෙකු වූ චිත්ත හා කාලදේවල ඇයගේ සහෝදරයන් අතින් මැරුම් කෑ බවත් පසුව යක්ෂයන් වී ඉපිද මව් කුස සිටි පණ්ඩුකාභය කුමරා රැකබලා ගත් බවත්,

"යක්ඛා භූත්වාන රක්ඛිංසු - උභො ගබ්භගේ කුමාරකං" යනුවෙන් මහා වංශයේ සඳහන් පාඨයකින් පැහැදිලි වෙයි.

පණ්ඩුකාභය කුමරු රජ වූ පසු කාලදේවල යක්ෂයා උදෙසා නුවරින් නැගෙනහිර දිසාවෙහි දේවාලයක්ද, චිත්‍ර රාජ යක්ෂයාට අභය වැවේ පහළ කොටසේ දේවාලයක්ද කරවා පිදූ බව මහාවංශයේ මෙසේ සඳහන් වෙයි.

"කාලවේලං නිවාසෙසි - යක්ඛං පුර පුරත්ථිමේ

යක්ඛංතු චිත්ත රාජං - තං හෙට්ඨා අභය වාපියා"

මෙම යක්ෂයන් සමග පණ්ඩුකාභය රජතුමා ඉතාමත් හිතවත්ව මහත් භක්තියෙන් යුතුව සිටි බවද සඳහන් වේ. පණ්ඩුකාභය රජතුමා චිත්‍රා නම් යක්ෂණියටද, වළවාමුඛී යක්ෂණියටද, මහේජ නම් යක්ෂයෙකුටද දේවාලයක් කරවා පුද පූජා පවත්වා ඇත.

බුදුරජාණන් වහන්සේ දෙවන වරටත්, තුන් වැනි වරටත් ලංකාවට වැඩමවන විට මෙහි වාසය කළේ නාගයන් බවත් ඔවුන් පෙර කී යක්ෂයන්ට වඩා උසස් බවත් වංශකතා සඳහන් කරයි. නාගයන් කෙරෙහි බය පක්ෂපාතී බවක් දක්වූ ඔවුන් නාග නමින් හැඳින්වූ නොදියුණු මිනිසුන් කොටසක් බව පෙනේ.

## වෘක්ෂ වන්දනාව

විවිධ වෘක්ෂයන්ට දෙවියන් අරක් ගෙන ඇතැයි විශ්වාස කළ පැරණි ලක්වැසියා රුක් දෙවියන් පිදීමෙන් තම ජීවිතයේ අභිමතාර්ථ සඵල කරගනු පිණිස කටයුතු කර ඇත. පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර බටහිර වාහල්කඩ සමීපයේ නුග රුකක් වෛශ්‍රවණගේ වාසභවන සඳහා පිදූ බව සඳහන්ය. එසේම තල් ගසක් ව්‍යාධ දෙවියන්ගේ වාසභවනය ලෙසද පුද පූජා කොට ඇත.

## දේව වන්දනාව

ලංකාවේ දේව ඇදහීම විජයාවතරණයටත් පෙර සිටම පැවැති ආගමික සිරිතකි. බුදුරදුන්ගේ ප්‍රථම ලංකාගමනයේදී සුමන නම් දෙවියෙකු තෙරුවන් සරණ ගොස් බුදුරජාණන් වහන්සේගෙන් පුද පූජා පිණිස කේශධාතු මිටක් ලබාගත් බව සඳහන් වෙයි. "ව්‍යාධ දේව" නමින් දඩයම්කරුවන්ගේ දෙවියෙක් වෙයි. දඩයම්කරුවන්ට ආශිර්වාද කරමින් දඩයම් සඵල කරදෙන දෙවියෙකු ලෙස කම්හල්කරුවන්ට ආශිර්වාද කරන දෙවියෙකු ලෙස කම්මාර දේව යනුවෙන් ඉටුදෙවියෙකු සිටි බව සඳහන් වෙයි. පුර දේව යනු අනුරාධපුරයට අරක්ගත් දෙවියෙකි. උත්පලවර්ණ (උපුල්වන්) නම් ලංකාවට අරක්ගත් දෙවියන්ය. විජය ඇතුළු පිරිසට ආරක්ෂාව සැලසුවේද මෙම දෙවියන්ය.

මහාවංශයේ 10 වෙනි පරිච්ඡේදයෙහි 102 ගාථාවේ සිවිකාසාලා හා සොත්ථිසාලා යනුවෙන් ගොඩනැගිලි විශේෂයක් පණ්ඩුකාභය රජතුමා විසින් කරවන ලද බවත් සඳහන් වෙයි. එයට විස්තරයක් ලියා ඇති මහාවංශ ටීකාවේ මෙසේ සඳහන් වෙයි.

"තත්ථ සිවිකාසාලා නාම සිවලිංග පතිට්ඨාපිත සාලා විජයනාගරංචා සොත්ථි සාලා නාම බ්‍රාහ්මණානං සොත්ථි වචනුච්චාරණ සාලා..."

මෙයින් හැඟෙන්නේ සිවිකාසාලා යනු සිවලිංගය පිහිටුවන ලද ශාලාව යන්නයි. මෙයින් හැඟෙන්නේ ශිව වෙයන් ගැනද එකල රටවැසියා දත සිටිය බවයි. ශිව ලිංග පූජාවද එද ජනප්‍රිය ආගමික චාරිත්‍රයකි.

පාසණ්ඩ - පරිබ්‍රාජක - ආජීවක - පුව්‍රජිත

ශ්‍රමණ නමින් හැඳින්වූ තාපස කොටසක්ද එකල ලංකාවේ වාසය කොට ඇත. ඔවුන් පාසණ්ඩ, පරිබ්‍රාජක, ආජීවක, පුව්‍රජිත යනුවෙන් හඳුන්වා ඇත. පණ්ඩුකාභය රජ දවස ජෝතිය හා ගිරි නිගණ්ඨයන් වාසය කළ ප්‍රදේශයෙහිම නොයෙක් පාෂණ්ඩකයන්ද ශ්‍රමණයන්ද එහි

"ලංකාවේ දේව ඇදහීම විජයාවතරණයටත් පෙර සිටම පැවැති ආගමික සිරිතකි. බුදුරදුන්ගේ ප්‍රථම ලංකාගමනයේදී සුමන නම් දෙවියෙකු තෙරුවන් සරණ ගොස් බුදුරජාණන් වහන්සේගෙන් පුද පූජා පිණිස කේශධාතු මිටක් ලබාගත් බව සඳහන් වෙයි."

සිටිය බව මහාවංශයෙහි සඳහන්ය. අනුරාධපුර අවසන් භාගයෙහි මිත්‍යාදෘෂ්ටි කුල පන්සියයක් වාසය කළ බව මහාවංශයෙහි 100 වැනි ගාථාවෙන් ප්‍රකාශ වෙයි. පඬුවස් දෙව්, භද්දකච්චායනා ආදීන් ලංකාවට පැමිණියේ පරිබ්‍රාජක හෝ පැවිදි වෙස් ගෙන බව සඳහන් වන අතර ඉන් පැහැදිලි වන්නේ පරිබ්‍රාජක හා පැවිදි බව ලබාගත් අය එද ලංකාව විසූ බවයි.

## බ්‍රාහ්මණ ආගම

විජයාවතරණයේ සිටම ලංකාවේ බමුණන්ද සමාජයේ ප්‍රධාන තැනක් ලබා සිටියහ. ඔවුන් ශිල්ප ඉගැන්වීම ආදියෙහි නිරත වූහ. උපතිස්ස ග්‍රාමය බිහිකළ උපතිස්ස බමුණා විජය රජුගේ පුරෝහිතයෙකි. දේවානම්පියතිස්ස රජු ධර්මාශෝක රජතුමාට තුටු පඬුරු යැවූ අවස්ථාවේ මහා අරිට්ඨ කුමරු ප්‍රධාන දූත පිරිසට බමුණෙකු ඇතුළත් වූ බව මහාවංශය සාක්ෂි දරයි. බමුණන් විසින් එක්රැස් වී ජනතාවට සෙත් පතා ස්වස්ති පාඨ කියන ස්ථානය සොත්ථි සාලා නම් වෙයි.

## ජෛනාගම

නිගණ්ඨ නමින් හැඳින්වෙන්නේ ජෛන ශ්‍රාවකයන්ය. ජෛන ආගමේ ශාස්තෘවරයා වූ මහාවීර දක්වා ඇත්තේ "නිගණ්ඨ නාථ පුත්තෝ" යනුවෙනි. පණ්ඩුකාභය රජු දවස ජෝතිය, ගිරි හා කුම්භාණ්ඩ යනුවෙන් නිගණ්ඨයෝ තිදෙනෙක් වූහ. සිංහලයන් ලංකාව පදිංචි වූ කාලයේ සිටම ජෛනයන්ද පදිංචි වී ඇත.

මෙසේ විවිධ ආගමික දර්ශනයන්ගෙන් පිරී පැවැත් ලක්බිම මිහින්දාගමනයෙන් උදාවූ බෞද්ධ ප්‍රබෝධයෙන් අප්‍රාණිත පුබ ඵල ගෙන දෙන මානව චින්තනයකින් පූජාපිත විය. වෘක්ෂ වන්දනාවෙහි නිරතව සිටි ලක්වැසියා ජය ශ්‍රී මහා බෝ සමිඳු ලංකාවට වැඩම කිරීමත් සමග අප්‍රමත් වෘක්ෂ වන්දනාවකට යොමු විය.

දෙවියන්ට පුද පඬුරු දී අදශාමාන බලවේගයකින් පිහිට පැතූ ලක්වැසියා දෙවියන්ට පින් පඬුරු දීමට තරම් බුද්ධගමෙන් ප්‍රබුද්ධමත් විය. යකුන් අරක් ගත් සේ සලකා බිලි පුද දුන් ගල් පර්වත ආදිය මිනිසාම බුදු බැතිය උතුරා යන සමාධි පිළිම බවට පත්කර ගත්හ.

ආගන්තුක වුවද, බුදු සසුන ලංකාවට ගෙනා උපරිම ආශිර්වාදයක් බවට පත්කර ගැනීමට ඔවුන් සමත් වූයේ එබැවිනි.

වික්‍රමසිංහ අතපත්තු

## පොසොන් පොහෝ දා සිහිපත් කළ යුතු

# චුල්ලහත්ථිපදෝපම සූත්‍රය

ශ්‍රී භාග්‍යවත් සර්වඥයන් වහන්සේගේ ශ්‍රාවක අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ, ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සහ අභිඥලාභී සුමන සාමණේරයන් වහන්සේ හා භණ්ඩුක නම් අනාගාමී උපාසක සමඟ [illegible] දී දඹදිව සිට ලක්දිවට වැඩම කළේ අදට පොසොන් පුන් පොහෝ දිනයකදීය. බුදු දහම ලැබීමට පෙර පොසොන් පොහොය දිනය ලක්වැසියාට සැණකෙළි දිනයක් විය. මිහිඳු මාහිමි ලක්දිවට වැඩම කළේ එබඳු සැණකෙළි දිනයකදීය. දේවානම්පියතිස්ස මහරජතුමා විනෝදය පිණිස දඩකෙළියේ යමින් සිටියදී මිහිඳු මාහිමියෝ දඹදිව සිට අනුරපුර 'මිස්සක' නම් පර්වතය වැඩම කොට

"සමණාමයං මහාරාජ - ධම්ම රාජස්ස සාවකා

තවෙව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා"

යනුවෙන්, "මහරජ ධර්ම රාජයාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ අප ඔබට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු" යි වදාළහ. ධර්මාශෝක පිය මහ රජුගේ ඉල්ලීම පරිදි ස්වකීය දේශයෙන් මිහින්තලේ මෙපිටිලාහට වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේ තිස්ස මහ රජුට සමඟින් සොළ ලක්වැසි සියලු ජනයාගේ හිත පිණිස, සුව පිණිස දම් දෙසූහ. එමගින් ලක්වැසි සිංහලයන්ට නුවණැස පහළ විය. ශීල, සමාධි, ප්‍රඥා ගුණසිරි සම්බුද්ධ ධර්මයේ ආලෝකයෙන්, මුළු දිවයිනම ආලෝකමත් විය. ලෞකික, ලෝකෝත්තර දියුණුවට මග හෙළි විණ. බෞද්ධ ප්‍රතිපත්ති හා ශිෂ්ටාචාරය දිවයින පුරාම ව්‍යාප්ත විය.

උන්වහන්සේ සිරිලකට සිදු කළ උදාර ශාසනික මෙහෙය අමරණීය එකකි.

අනුරපුර මහමෙව්නාවේ සීමාමාලක ආදිය පිහිටුවා අටමස්ථානය පිහිටුවන තැන්ද දක්වා වදාළ මිහිඳු මාහිමියෝ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කරවීමටද මුල් වූහ. ආගම උසට හැඩි, දාගැබ්, විහාරාරාම ගොඩනැගුණේත්, බෞද්ධ කලා ශිල්ප උන්නතිය හා සංස්කෘතික ප්‍රබෝධයත් ඇතිවූයේත් මහින්දාගමනය නිසාය. ගස්, ගල් ආදී ස්වභාවධර්මයන් ඇතුළු නොපෙනෙන බලවේගයන් හා පෙන ආදී විධ්‍ය ධර්මයන් ඇදහූ සිංහලයන් බෞද්ධයන් බවට පත්වීමෙන් අනතුරුව බලවත් සමාජ පෙරළියක් සිදුවිය. දැහැමි සරල ගොවි ජීවිතයක් අපට ලැබුණේ බුදු දහම නිසාය. එබඳු විශිෂ්ට සේවාවක් සිදුකළ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ පොසොන් පුන් පොහෝ දිනයේදී අනුස්මරණය කොට ආමිස ප්‍රතිපත්ති පූජාවන්හි යෙදීම සිංහල බෞද්ධයන් සතු පරම යුතුකමකි.

පොසොන් පොහෝ දින විශේෂයෙන් චුල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාව සිහිපත් කිරීම ඉතා වටනේය. 'අඹ රුක්' උපමාවෙන් ප්‍රශ්න විචාරා දුන් පිළිතුරුවලින් තිස්ස මහරජතුමා හොඳ නුවණැතියකු බව දත රජතුමා ඇතුළු බුදු දහම කෙරෙහි පැහැදවීම සඳහා පළමුව දේශනාකොට වදාළේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රයයි. මජ්ඣිම නිකායේ සීහනාද වග්ගයේ එන චුල්ලහත්ථිපදෝපම සූත්‍රය හා මහාහත්ථිපදෝපම සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ "අනේපිඬු සිටුතුමාගේ ආරාමයේ" වැඩසිටි සමයෙහි දේශනාකොට වදාළ සූත්‍ර ධර්ම දෙකකි. එය මිහිඳු මහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස මහරජතුමා ඇතුළු පිරිසට දේශනාකොට වදාළේ සැවැත් නුවර ජානුස්සෝණි බ්‍රාහ්මණයා



[illegible]



“ මජ්ඣිම නිකායේ ඕපම්ම වග්ගයේ එන චූලහත්ථිපදෝපම සූත්‍රය හා මහාහත්ථිපදෝපම සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ "අනේපිඬු සිටුවරයාගේ ආරාමයේ වැඩසිටි සමයෙහි දේශනාකොට වදාළ සූත්‍ර ධර්ම දෙකකි. ”

හා වාත්ස්‍යායන (පිලෝතිකා) පරිබ්‍රාජකයා අතර ඇතිවූ සංවාදයක් මුල් කොට බුදුරජාණන් වහන්සේ දේශනා කළ චූලහත්ථිපදෝපම සූත්‍රයයි.

බුදුරජාණන් වහන්සේ හැඳිනගන්නා ආකාරයත්, තෙරුවන් ගුණයත් මෙම සූත්‍ර දේශනාවෙන් විස්තර වෙයි. තිස්ස රජු හා පිරිසට මෙම සූත්‍ර දේශනාව දේශනා කිරීමට හේතුවූයේ හට අරහා දී ප්‍රතිගුණවලින් යුතු භාග්‍යවතුන් වහන්සේ හා ත්‍රිවිධ රත්නය කෙරෙහි රජු ඇතුළු පිරිසගේ සිත වඩා වර්ධනය කොට පොළඹවනු පිණිසය. එම දේශනාව අවසානයෙහි තිස්ස මහාරජතුමා ඇතුළු පිරිස තෙරුවන් සරණ ගියහ.

චූලහත්ථිපදෝපම සූත්‍රයෙහි විස්තර වන අයුරු ජාණුස්සෝණි නම් බ්‍රාහ්මණයා සුදෙන් සුදු අසුන් යෙදූ රථයක නැගී මහ දහවල් සැවැත් නුවර පැදකුණු කිරීම සිරිතක් කොට ගෙන සිටියේය. දිනක් ඒ එන අතර මඟදී බුදුන් උපස්ථානයට ජේතවනාරාමයට ගොස් පෙරළා පැමිණෙන වාත්ස්‍යායන (පිලෝතිකා) නම් පරිබ්‍රාජකයා හමු වූ ජාණුස්සෝණි බ්‍රාහ්මණයා වාත්ස්‍යායන පිරිවැජියාගෙන් "මහ දහවල් කොහි සිට එන්නේ දැයි" විමසීය. එවිට ඔහු "මම ශ්‍රමණ භගවත් ගෞතමයන් වහන්සේ සමීපයේ සිට පැමිණියෙමි." එවිට ජාණුස්සෝණි බ්‍රාහ්මණයා, "ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ප්‍රඥාව ගේ වියත් බව කෙසේද දැයි" ද "පණ්ඩිතයෙකැයි සිතන්නේ දැයි" ද විචාළේය.

එකල්හි වාත්ස්‍යායන පිරිවැජියා පිළිතුරු දෙමින් "බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥා පාටවය දැන ගැනීමට මම කවරෙක් වෙම්ද? එය ජානන්නෙකුම දැනගත හැක්කේ බුදු කෙනෙකුන් වහන්සේ විසින්මය." එවිට ජාණුස්සෝණි බ්‍රාහ්මණයා "ඔබ ගෞතමයන් වහන්සේට සිදු කරන්නේ උදාර පැසසුමකි" යි කීය. එවිට වාත්ස්‍යායන පිරිවැජි තෙමේ "ගෞතමයන් වහන්සේ පැසසීමෙහි මම කවරෙක් වෙම්ද? ගෞතමයන් වහන්සේ ප්‍රශස්ත ගුණයෙන් ප්‍රශස්තය. දෙවි මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය. වාත්ස්‍යායන කවර කරුණක් දැක ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි පැහැදුනේද" එවිට වාත්ස්‍යායන පිළිතුරු දෙමින් "ඇතුන් අල්ලන දක්ෂ පුරුෂයෙකු දිග් වූ පුළුල් වූ ලොකු ඇත් පා දැක මේ ඇත් රජෙකැයි දැනගන්නේ යම් සේද, මම ද භාග්‍යවතුන් වහන්සේගේ ගුණ පද සතර දැක භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ බව, ධර්මය ස්වාක්ඛාත බව, ශ්‍රාවක සංඝයා වහන්සේ සුපටිපන්න බව දැන ගතිමි.

"පණ්ඩිත ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටි බිඳින ඇතැම් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති ශ්‍රමණ යන පඬිවරු ප්‍රශ්න විචාරීමෙන් වාදාරෝපණයටත් වඩිති බස් කියා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේ හා ප්‍රශ්න විචාරීමට වාද කිරීමට නොහැකිව ගෞතමයන් වහන්සේගේම ශ්‍රාවකයෝ වෙත්. යම් දිනෙක මම ඒ අයුරු පද සතර දැක ගත්තෙම්ද එතැන් මම භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය ධර්මය ස්වාක්ඛාතය සංඝයා වහන්සේ සුපටිපන්නය" යනුවෙන් පිළිගතිමි.

මෙසේ කී කල්හි ජාණුස්සෝණි

"ධර්මය හොට පසුපස්සෙන්නට නේද ධර්ම විනයය කළුණ බිරි ප්‍රඥාවෙන් ප්‍රත්‍යවේ ගෙමින් වඩින්නට සිදුවේ"


[illegible]

> "මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට තිස්ස රජු ප්‍රමුඛ පිරිසට දේශනා කොට වදාළේ චූළහත්ථිපදෝපම සූත්‍රයයි. මෙම සූත්‍ර දේශනාව ඇසූ තිස්ස මහරජු ඇතුළු සතළිස් දහසක් පිරිස තිසරණ සහිත පන්සිල්හි පිහිටා බෞද්ධයෝ බවට පත්වූහ."

[illegible]

මෙම සූත්‍ර දේශනාවෙන් ත්‍රිවිධ රත්නයේ උසස්කම්, [illegible] ප්‍රකාශ වෙයි. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට තිස්ස රජු ප්‍රමුඛ පිරිසට දේශනා කොට වදාළේ චූළහත්ථිපදෝපම සූත්‍රයයි. මෙම සූත්‍ර දේශනාව ඇසූ තිස්ස මහරජු ඇතුළු සතළිස් දහසක් පිරිස තිසරණ සහිත පන්සිල්හි පිහිටා බෞද්ධයෝ බවට පත්වූහ. [illegible] නිර්වාණාවබෝධය [illegible] කළ යුතුය.


[illegible]
පූජ්‍ය ගිනිබටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ
ශේඛංකර නායක ස්වාමීන් වහන්සේ
විසිනි



[illegible]

අපි නොදන්න

## නීතිය



# පන්සලක විහාරාධිපති තනතුර සහ දේපොළ බෙදී යන්නේ මෙහෙමයි

විහාරාධිපති භික්ෂුවගේ ඇවෑමෙන් උන්වහන්සේ සන්තක දේපොළ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට උරුමවීම සිරිතකි. විහාරාධිපතිකම පිළිබඳ සිවිල් නීතිය ගොඩනැගී තිබෙන්නේ එම සිරිත් නීතිය පදනම් කරගෙනය. ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පිළිබඳ නීතිමය මූලධර්මය බුද්ධාගමෙහි සඳහන් නොවන්නකි. ඇන්ටන් බර්ටන් අගවිනිසුරුතුමා 1918-26 නව නීති වාර්තා 385 දරන නඩුවේදී මෙසේ ප්‍රකාශ කොට ඇත. "ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පිළිබඳ සම්ප්‍රදායේ ප්‍රභවය පැහැදිලිව සොයාගත නොහැක. එහෙත් විනය පිටකයෙහි මහාවග්ග පාලියේ චීවර ඛන්ධකයේ සඳහන් යෙදුම් ඇසුරින් එහි ආරම්භය සිදුවන්නට ඇත. මහාවග්ග අට්ඨකථා ඛන්ධකයේ දක්වෙන පරිදි නිශ්චිත වශයෙන් එක් භික්ෂුවකට යම්කිසි පූජාවක් කිරීමට බුදුරදුන්ගෙන් අවසර ලැබී ඇත. බුද්ධඝෝෂ හිමියන් එම වැකිය සමන්තපාසාදිකාවේ මෙසේ පැහැදිලි කර ඇත. "අදින් මෙය ඔබවහන්සේලාට සහ ඔබවහන්සේලාගේ අන්තේවාසිකයන්ටද දෙමි යනුවෙන් කියයිද? එය සෙරුන්ටද, අතවැසියන්ටද හිමිවේ."

ජ්‍යෙෂ්ඨත්වය අනුව අයිතිය ලබාදීමට හේතුවන්නට ඇත්තේ "පළමුවැන්නාට දෙයි" (ආදිස්ස දෙති) යන යෙදුම විය හැක. "1918-26 නව නීති වාර්තා 385 දරන නඩු වාර්තාවේ තවදුරටත් සඳහන් පරිදි, ගුරුවරයාගේ දිවිනාවට හිමිකම් තිබෙන්නේ පැවිදි වීමෙන් (පබ්බජ්ජන්තේවාසික) හෝ උපසම්පදාවීමෙන් (උපසම්පදන්තේවාසික) ශිෂ්‍ය භාවයට පත් අතවැසියාට හෙවත් ශිෂ්‍යයාට පමණි. නිස්සීම සඳහා (නිස්සයන්තේවාසික) හෝ ධර්මය හැදෑරීමට (ධම්මන්තේවාසික) හෝ සමීපයෙහි වෙසෙන අතවැසි ශිෂ්‍ය භික්ෂුවකට එම ගුරුවරයා සතු දේපොළට අයිතිවාසිකම් කිව නොහැක. 1910-14 නව නීති වාර්තා 400 දරන නඩුවේදී අස්ගිරි-මල්වතු උභය මහා විහාරයේ මහනාහිමිවරුන්, විද්‍යෝදය පිරිවෙණේ මහගොඩ ඤාණිස්සර නාහිමියන් ඇතුළු භික්ෂූන් හත් නමක් අධිකරණයට ලබාදුන් වාර්තාව බෞද්ධ සාම්ප්‍රදායික සිරිත් නීතිය පැහැදිලි කරගැනීමට ඉතා වැදගත් වූවකි. ශිෂ්‍යයා පිළිබඳ නීතිමය තත්ත්වය, ජ්‍යෙෂ්ඨත්වය හා අනුප්‍රාප්තික අයිතිය පිළිබඳව විග්‍රහයක් එහි දක්වෙයි. අධිකරණය ඇසූ ප්‍රශ්නවලට භික්ෂු මූලස්ථාන මගින් පිළිතුරු සපයා ඇත්තේ මේ අයුරිනි.

1. මහණ කිරීම හෝ උපසම්පදාව අනුව ශිෂ්‍ය භාවය ඇතිවේ. 2. භික්ෂුවකට පැවිදි ගුරුවරුන් දෙදෙනකු සිටිය හැක. ශිෂ්‍යයා වශයෙන් ඒ දෙදෙනාගෙන්ම අනුප්‍රාප්තික අයිතිවාසිකම් හිමිවෙයි. 3. ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරන්නේ පැවිදි කිරීමේ දිනය පදනම් කරගෙනය. 4. පැවිදි කළ ගුරු හිමියන් සිවුරු හැර ගියහොත්, එම භික්ෂුවගේ ශිෂ්‍යයෙකු වශයෙන් තිබෙන අනුප්‍රාප්තික අයිතියට බාධා නොවේ. ගුරු භික්ෂුව සිවුරු හැරීම මරණයට පත්වීමකට සමානය. ඔහුට පන්සලේ කිසිදෙයකට අයිතියක් නොමැත. පෞද්ගලික දෙයක් ඒගෙන යාමට හැකිය. 5. විහාරාධිපති භික්ෂුවකට ශිෂ්‍යයන් කිපදෙනෙකු සිටිනවා නම්, ඒ සියලු දෙනාටම අනුප්‍රාප්තික අයිතිවාසිකම් තිබුණත්, ඒ අතරින් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා රීතියට අනුව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා විහාරාධිපතිකමට පත්වෙයි. අනෙක් ශිෂ්‍යයන්ට පන්සලේ සිටීමේ සහ එහි ආදායමෙන් යැපීමේ අයිතිය තිබේ. 6. ජ්‍යෙෂ්ඨත්වය නොසලකා ඕනෑම ශිෂ්‍යයෙකු අනුප්‍රාප්තික විහාරාධිපති ලෙස නම් කරන්නට ගුරුවරයාට පුළුවන. 7. පන්සලක ශිෂ්‍ය පරම්පරාව අහෝසි වුවහොත්, එම පැවිදි පරපුරේ මුලට සම්බන්ධ භික්ෂූන්ට අයිතිය පැවරෙන අතර, එම භික්ෂූන්ගේ කැමැත්ත අනුව එම පරපුරේ මහනාහිමි සුදුසු භික්ෂුවක් විහාරාධිපතිකමට පත්කරයි. 8. එවැනි සිසු පරපුර අහෝසි වූ පන්සලකට පත්කරන භික්ෂුවගේ විහාරාධිපතිකම ජීවිත කාලයට සීමාවේ. එසේ නැතිනම් ඒ භික්ෂුවගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයිතිය පැවරෙන ආකාරයෙන් පත්කරන්නටද පුළුවන. එය තීරණය වන්නේ පත්වීම ලබාදෙන ස්වරූපය අනුවයි.

එකම දිනයෙහි පැවිදි වූ හෝ උපසම්පදාව ලැබූ ශිෂ්‍ය භික්ෂූන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරගැනීම ගැටලුවකි. එකම දිනයේ පැවිදි උපසම්පදා ලැබුවත්, එය විසඳා ගන්නේ මුලින් පැවිදි වූයේ කවුරුන්ද? පසුව පැවිදි වූයේ කවුරුන්ද? යන්න සිදුකෙරුණු පෙරළාව අනුව තීරණය කිරීමෙනි. ඒ සඳහා ලේඛනගත හා වාචික සාක්ෂි යොදාගනී. 1997-2 නව නීති වාර්තා 101 දරන නඩුවේදී එම ගැටලුව මතුවිය. පැවිදි කිරීමට සහභාගී වූ අයගේ සාක්ෂි, අපවත් වූ ගුරු හිමියන්ගේ මරණ දැන්වීමේ මුලින් යෙදුණ නම, භික්ෂුමතවලදී අනුන් ගන්නා අනුපිළිවෙළ, ලියාපදිංචි ලේඛන ආදී වැනි කරුණු විමසා බැලීමෙන් අධිකරණය ජ්‍යෙෂ්ඨත්වය තීරණය කර ඇත.

විහාරාධිපතිකම දැරීමේ වැඩි අයිතිය ඇත්තේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භික්ෂුවටයි. ශිෂ්‍ය භික්ෂූන් සම්මත කරගත් පටිපාටියකට අනුව පිළිවෙළින් ඒ පිරිස විහාරාධිපති තනතුරට පත්කරන පන්සල්ද තිබේ. එය ශිෂ්‍යානුශිෂ්‍ය ක්‍රමය නොවේ. කිසියම් පන්සලක අයිතිකම පත්කිරීම් සම්බන්ධයෙන් එවැනි විශේෂිත ක්‍රමයක් නොමැති නම්, එම පන්සලට විහාරාධිපති කෙනකු පත්කිරීමේ නීතිමය මූලධර්මය වන්නේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා ක්‍රමයයි. නමුත් පෙර සිටි විහාරාධිපති හිමිවරුන් ශිෂ්‍යානුශිෂ්‍ය ක්‍රමයට පත් නොවූ පන්සලකට එම ක්‍රමය අදාළ නොවන්නට පුළුවන. ඒ අනුව මුල්කිරිගල විහාරාධිපති තනතුර ශිෂ්‍යානුශිෂ්‍ය සම්ප්‍රදායෙන් වෙනස් වූවකි. විහාර දේපොළ පිළිබඳ වැඩි අයිතිවාසිකම් තිබෙන්නේ වැඩිහිටි භික්ෂුවටයි. එම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භික්ෂුව විහාරාධිපති තනතුරට ඇති අයිතිවාසිකම ස්වකැමැත්තෙන් අත්හරියි නම්, උන්වහන්සේට වයසින් බාල ඊළඟ කෙනෙකුට විහාරාධිපති ධුරය ලැබෙයි. එසේ වුවත් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා මූලධර්මය අනුව මුල් අයිතිය තිබුණ වැඩිහිටි භික්ෂුවගේ ශිෂ්‍යයෙකුට පසු දවසක විහාරාධිපති තනතුර ඉල්ලීමේ අයිතියක් නොමැත. ගුරුවරයා අයිතිවාසිකම් අත්හැරිය බැවිනි. එය හිමිවන්නේ විහාරාධිපති තනතුරට අලුතෙන් පත් භික්ෂුවගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි. 1889දී වාරණ විහාරයේ විහාරාධිපති සම්බන්ධව 76 නව නීති වාර්තා 73 මගින් එය පැහැදිලි වෙයි.

අදාළ විහාරස්ථානයේ ආගමික සේවාවන් ඉටුකිරීම, එයින් යැපෙන්නන් රැකබලා ගැනීම සහ දේපොළ සංරක්ෂණය කොට පාලනය කිරීම විහාරාධිපති භික්ෂුවගේ වගකීමයි. එය භික්ෂුවක වශයෙන් සම්බුද්ධ ශාසනය කෙරෙහි පවතින ආධ්‍යාත්මික බැඳීම මත ගෞරවාන්විතව හා අවංකව සිදුකළ යුත්තකි. ධර්ම විනයට පටහැණිව ශාසනික දේපොළ අයුතු ලෙස පරිහරණය බරපතළ වරදකි. "මහණෙනි, සැදැහැයෙන් දිදු දෙය විනාශ නොකරන්න" යනු එම බුද්ධ නියමයයි.

**පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි**
**අස්ගිරි මහා විහාරීය කාරක සංඝ සභික ගරු**
**අනුශාසක - සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය**


"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."




"යොදණ්ඩෙන අදණ්ඩෙසු අපපදුටෙඨසු දුසසති
දසනන මඤ්ඤතරං ඨානං ඛිපපමේව නිගචඡති"

"අනුන්ට හිංසාවක්, වරදක් නොකළ, දඬුවමකට නුසුදුසු වූ, අහිංසක, නිදොස් උතුමන්ට, යම් වරදක්, විපතක් පමුණුවන්නේ ද, ඔහු දස දුක්වලින් එකකට වහාම පැමිණෙයි."

# නිදොස් උතුමන්ට
# ගැ ර හී ම
# විපත් සිදුකිරීම
# මහත් දුකට හේතුවේ



පූජ්‍ය හිඹිඩුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ මේධංකර



පින්වත්නි,

අද උතුම් පොසොන් පුන් පොහෝ දිනයයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සිවුනමක්, සව්අභිඥාලාභී සුමන සාමණේරයන් වහන්සේත්, භණ්ඩුක නම් අනාගාමී රජකිය උපාසකයාත් බුද්ධ වර්ෂ 236 වැන්නේ දී දඹදිව වේදිසගිරි නුවරින් ලක්දිව අනුරපුර මිස්සකපව්වට වැඩම කළේ අද වන් පොසොන් පොහෝ දිනයකයි. මිහිඳු මහරහතන් වහන්සේ මිස්සක පව්වට වැඩමකිරීමෙන් අනතුරුව දඩකෙළියෙහි යමින් සිටි තිස්ස රජු ධර්ම මාර්ගයේ ගමන් කරවීමට ප්‍රමාණවත් බුද්ධිමතෙක්දැයි විමසා බලා, ඇත් පියසටහන් උපමා කොට, තුනුරුවන් කෙරෙහි ඇති උත්තම බව, භික්ෂූන්ගේ වාසී, ගුණගරුක, ශ්‍රේෂ්ඨ ජීවිත පැවැත්ම හා චතුරාර්ය සත්‍ය ධර්මය ආදිය ඇතුළත් චූල්ලහත්ථිපදොපම නම් සූත්‍ර දේශනාව කළ සේක. එම දේශනාව ශ්‍රවණය කළ රජතුමා ඇතුළු හතළිස්දහසක් පිරිස තිසරණ හා පන්සිල්හි පිහිටුවීමෙන්, මෙරට බෞද්ධ රටක් බවට පත්කරන ලදී. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමෙන් ශ්‍රේෂ්ඨ බුද්ධාගමත්, බෞද්ධ සිරිත්විරිත්, නිර්මල බෞද්ධ සංස්කෘතියත්, ශ්‍රේෂ්ඨ බෞද්ධ සභ්‍යත්වයත් අපට ලැබුණු දිනය වශයෙන් ද, සිංහල බෞද්ධයන්ගේ ජීවිත ආලෝකමත් කිරීමට නව ජීවන දර්ශනයක් ලැබුණ දිනය වශයෙන් ද පොසොන් පොහෝ දිනය ලක්දිව බෞද්ධයන්ට අතිශයින් වැදගත් පොහෝ දිනයකි.

මෙම උතුම් පොහෝ දිනයේදී නිදොස් උතුමන්ට දැන හෝ නොදැන නින්දා අපහාස කිරීම, ශාරීරික පෙළීම් හෝ විපත් සිදුකිරීම යනාදියෙන් වැළකී, ඔවුන් පිදීමේ වැදගත්කම අවබෝධ කරගෙන කටයුතු කළ යුතුය.


"වෙදනං ඵරුසං ජානිං සරීරසස ච භෙදනං
ගරුකං වාපි ආබාධං චිත්තකෙඛපං ච පාපුණෙ
රාජතො වා උපසසගගං අබභකඛානං ච දාරුණං
පරිකඛයං ච ඤාතීනං භොගානං ච පභඞගුරං
අථවසස අගාරානි අගගි ඩහති පාවකො
කායසස භෙදා දුපපඤෙඤා නිරයං සො පපජජති"


"නිදොස් උතුමන්ට අවැඩ කරන තැනැත්තා, දස දුක් අතුරෙන් දරුණු වේදනාවකට හෝ, ධන සම්පත් පිරිහීමකට හෝ, සිරුර සිඳීමකට හෝ, දරුණු රෝගයකට හෝ, උමතු බවකට හෝ රජුන්ගෙන් වන උවදුරකට හෝ, දරුණු බොරු දෝෂාරෝපණයකට ලක්වීමකට හෝ, නෑයන් පිරිහීමකට හෝ, සම්පත්තීන්ගේ නැසීමකට හෝ පැමිණේ. එසේ නැතහොත් ඔහුගේ නිවස ගින්නෙන් දැවීමකට හෝ පත්වන්නේය. නිදොස් උතුමන්ට අවැඩ කළ ඒ අනුවණයා, මරණින් පසු නිරයෙහි ද උපදින්නේය."

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

දරුණු වේදනා නම් පහර වැදීම, අත්පා කැඩීම, කැපීම, වශයෙන් හට ගැනෙන කටුක වේදනාවන්ය. සම්පත් පිරිහීම යනු අව්වෙන්, වැස්සෙන් පෙළෙමින් සේවාකම් කිරීමෙන් හා වෙළෙඳාම් කිසාම් කිරීමෙන් දුක සේ උපයා ගත් ධන සම්පත් විනාශ වීමය. සිරුර බිඳීම යනු මළ පැලීම, අත් පා සිඳීම, වෙඩි තැබීම යන මෙයින් සිරුරට සිදුවන හානියයි. දරුණු ආබාධයක් යනු සිවුනොවුන් බියගන්වන දරුණු රෝග හටගැන්මය. රජුන්ගෙන් වන උවදුරු යනු තනතුරුවලින් පහකිරීමෙන් හා ධනය පැහැරගැනීමෙන් ඇතිවන උවදුරුය. දරුණු බොරු බස් පවසා කීම යනු තමා නොඇසූ, නොසිතූ, නොදුටු බලගතු අපරාධයක් තමා විසින් කළ සේ දොස් නැඟීම් අසන්නට ලැබීමය. නෑ ජනයාගේ පිරිහීම යනු විපතෙහි පිහිටවන සැපතෙහි තොස්වන නෑහිතවතුන්ගේ නැසීමය. සම්පත්තීන්ගේ වැනසීම යනු මතුවැඩ සඳහා රැස්කොට තිබූ රන්, රිදී, මුතු, මැණික්, වී, සහල්, තල, මුං ආදී වස්තූන්ගේ විනාශයයි. ගෙවල් ගිනිගැනීම යනු තමන් වෙසෙන ගෙවල් නොයෙක්විට ගිනි ඇවිළී දැවීමය.

මුගලන් මහතෙරුන් වහන්සේ පෙර අත්භවෙක තමන්ගේ බිරිඳගේ බසට මුලාවී මහලු අන්ධ දෙමාපියන් වනයට ගෙනගොස් සොරුන් තලනා ලෙසට පහරදී තලා, මරා වනයෙහි දමා ආවේය. ඒ අකුසලය ආත්මභවයන් කීපයකදීම පළදුන් බව බෞද්ධ සාහිත්‍යයේ විස්තර වේ. රහත්වූව ද දෙවරක්ම සොරුන්ගේ ගැහැටින් මිදී ගිය අතර, පෙර කළ විපාකය නොවිඳිය හැකි නිසා තුන්වන වාරයෙහි තමන් වහන්සේ වැඩසිටි ගල්ලෙනෙහිම වැඩවිසූ නිසා සොරුන්ගේ තාඩනයට පීඩනයට ලක්ව පිරිනිවන්පෑමට සිදුවිය. මෙබඳු අවසානයක් ඍද්ධිභාවයෙන් අගතැන්පත් මුගලන් මහතෙරුන් වහන්සේට ද අයත්විය. එසේ බැවින් නිදොස් උතුමන්ට නින්දා, විපත් සිදුකරන තැනැත්තාවද ගැලවීමක් ලද නොහැකි බව වටහා ගත යුතුය.







නිදොස් උතුමන්ට විපත් සිදුකිරීමේ විපාකයන් ගැන කියවෙන්නේ ධම්මපදයෙහි පමණක් නොවේ. සිඟාලෝවාද සූත්‍ර දේශනාවේ ද උතුමන්ට ගැරහීම, අපවාද කිරීම, පීඩාවට ලක්කිරීම වසල ක්‍රියාවක් බව දේශනා කොට ඇත. යමෙක් සම්බුද්ධරජාණන් වහන්සේට හෝ, ආර්ය ශ්‍රාවකයන් වහන්සේ නමකට හෝ, යම් උපාසකයෙකුට හෝ අපවාද කෙරේ නම් ඔහු වසලයෙකි. යමෙක් තමාගේ මව හෝ, පියා හෝ සොහොයුරන් ආදීන් පෙළයිද, ඔවුන් වචනයෙන් හෝ කෝප කරයි ද ඔවුහු ද වසලයෝ වෙති. මේ අයුරින්ලා සලකන විට නිදොස් උතුමන්ට නින්දා අපහාස, තාඩන පීඩන සිදුකිරීම අකුසල් විපාක විඳීමට සිදුවන පාපී වසල ක්‍රියාවක් බව පැහැදිලි වෙයි.

අනන්තවූ ගුණයෙන් හෙබුනා වූ මහාකාරුණික බුදුරජාණන් වහන්සේට ද, චිංචිමාණවිකාව තීර්ථකයන්ගේ බස් අසා මහත් නින්දා අපහාස සිදුකරන ලද බව, මහාපදුම ජාතකයෙන් හෙළිවෙයි. බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි තීර්ථකයෝ තම ලාභයන් පිරිහී ගිය බැවින්, බුදුරජාණන් වහන්සේට කිලුටක් කිරීම පිණිස බොරු චෝදනා නැඟීමට කතිකා කොට ඒ සඳහා චිංචිමාණවිකාව යොදාගත්හ. ඒ අනුව චිංචිමාණවිකාව සවස් කාලයේ ජේතවනාරාමයට යන මග නොයෙක් දෙනාට පෙනෙන්නට සිට රාත්‍රී කාලයෙහි තීර්ථකයන් සිටින ගෙදරක නැවතී සිට පහන්වූ පසු නිවසට යාමට පුරුදුවූවාය. ඇය දකින දකින මිනිසුන්, ඔබ කොහේ යන්නේදැයි විමසන විට ඔවුන් තුළ කුතුහලයක් ඇති කරවමින් මම ජේතවනාරාමයෙහි බුදුන් ළඟ ශ්‍රීගන්ධ කුටියෙහි ලැග සැතපුණු බව පවසා, අවසානයෙහි කුසෙහි කෝටු මිටියක් බැඳගෙන, මේ මගේ කුසට දෙමසයි, තුන්මසයි, බුදුන්ගේ දරුවායයි කියමින් කල්ගෙවූවාය.

අවසානයෙහි සර්වඥයින් වහන්සේ ධර්මශාලාවට ගොස් බණ පිරිස් මධ්‍යයේ සිට, තුඹ වහන්සේ බණ පිරිස් පිරිවරාගෙන බණ කියන සේක්ද? මගේ දරුගැබ මුහුකුරා දසරකට මස් පිරිණේය. මට වදන්න ගෙයක් කොයිද? ඔබවහන්සේ දන්නේ මා හා කැටුව රති ක්‍රීඩාවේ යෙදෙන්නට පමණ ද? දරුවන් වදන්ට අවශ්‍ය දේ ඔබ නොදන්නෙහි ද? කොසොල් රජුට කියාවත්, අනේපිඬු සිටාණන්ට කියාවත්, විශාඛාවට කියාවත් මට ඊට පහසුකම් නොසලසා බණ වදාරන්නේ ඇයිදැයි විමසුවාය. සර්වඥයන් වහන්සේ, තමන් වහන්සේට නිෂ්කාරණේ කරන ලද නින්දාව අසා නිහඬව වැඩහුන් සේක. එකවිලෙහි ශක්‍රදේවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවී චිංචිමාණවිකාවගේ බඳිනා ලද දර මිටිය කපා දමන්න යැයි දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙකුට නියම කොට යැවූහ. දිව්‍ය පුත්‍රයන් සතර දෙනා මී වෙසක් මවාගෙන ගොස් දරමිටිය කපාහෙලූහ. බඩවසාගෙන සිටි පෙරවිකඩත් පහකළහ. එතැන රැස්වී සිටි පිරිස නිෂ්කාරණේ බුදුන්ට චෝදනා කළැයි, අපහාස කළැයි, කැටමුගුරු ගෙන ගැසූ කල්හි, චිංචිමාණවිකාව මහපොළොව පළාගෙන අවීචි මහනරකයට ඇදගෙන යන ලදී. ඇයට ඒ අත්භවයෙහිම නිදොස් බුදුරජාණන් වහන්සේට කළ පාපී ක්‍රියාව පළදුන්නේය.

වර්තමානයෙහි ද ඇතැම් පව්කාර පුද්ගලයන් බොහෝ නිදොස් උතුමන්ට නින්දා අපහාස කරන අයුරු අප දැක තිබේ. ඔවුන්ට ඒ මොහොතේ හිතවූ සතුටක් ඇතිවූව ද යටකී දසදුක් අතුරෙන් කිසියම් හෝ දුකකට පත්ව අවසානයෙහි අපාගත වනු නියතය. එබැවින් මෙම උතුම් පොසොන් පොහෝ දිනයේ දී නිදොස් උතුමන්ට ගර්හා, අපහාස, නින්දා, පෙළීම් සිදුකිරීමට යාමෙන් වැළකී සිටීමටත්, උතුම් දහම් මඟෙහි හැසිරී මෙලොව පරලොව යහපත සලසා ගැනීමටත් අදිටන් කර ගනිමු. තෙරුවන් සරණයි.

"යම් තැනක සිට පාපී විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුදු මැදත් නැත. පර්වත අතරයෙහිත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොතේවත් ඇත්තේ නැත."

# තාලයකට අනුව බණ කීම සුදුසුද?

බුදුරජාණන් වහන්සේ විසින් ගිහියන්ට ශික්ෂා පදත් භික්ෂූන් වහන්සේට විනය නීතිරීතින් පැනවූයේ සිදුවිය හැකි කුමන හෝ අයහපතක්, අනතුරක් වැළැක්වීමට බව පැහැදිලිය. වසර දෙදහස් පන්සිය ගණනකට පෙර දේශනා කළ දේශනයක් එදටත් වඩා අදට කොතරම් නම් වලංගුදැයි අමුතුවෙන් පැවසිය යුතු නොවේ.

'භික්ෂූන් වහන්සේ ගීත ස්වරයෙන් ධර්මය දේශනා නොකළ යුතුය' යන්නද බුදුරජාණන් වහන්සේ පැනවූ විනය ශික්ෂාවකි. භික්ෂූන් වහන්සේ විසින් ධර්මය හෝ පිරිත් දේශනාවක් පන්ත ස්වරයට හසුවන ආකාරයට ගීතවත්ව ගායනා නොකළ යුතු බව බුදුහු අවධාරණය කළහ. ආර්ය විනයට අනුව විලාපයක් බව බුද්ධදේශනාවේ සඳහන්ය. පිරිතක් හෝ ධර්ම දේශනාවක් මන්ත්‍රයක් සේ ජප කිරීමවත්, ගීතයක් සේ ගායනා කිරීමවත් භික්ෂුවකට සුදුසු නොවේ. එසේ කරන්නේ නම් ඒ බුදුරජාණන් වහන්සේ පැනවූ විනය නීතියක් කඩ කිරීමකි. පිරිතක් හෝ ධර්මයක් ස්වර රටාවන්ට හසු නොවන පරිදි නොවේ නම් තාලයකින් තොරව හෙවත් සරභඤ්ඤයෙන් දේශනා කිරීම පමණක් සුදුසු බව දේශනා කළහ.

- සරභඤ්ඤයෙන් දේශනා කිරීමත් ගීත ස්වරයෙන් ගායනා කිරීමත් අතර වෙනස කුමක්ද?

නෘත්‍ය, ගීත, වාදිත යන්න එකිනෙකට බැඳී පවතින ක්‍රියාවන්ය. ගායනයට අනුව වාදනයත්, එයටම නර්තනයත් එකිනෙකට මුසුව පැවතීම ස්වභාවයකි.

පන්ත ස්වරයෙන් ගායනා කරන ගීතයක් සම්බන්ධයෙන් වාදනයත්, නර්තනයත් මුසුවේ. හෝරයේ නම් ගීත ස්වරය ශ්‍රවණය වීමෙන් සිතින් තාලය ඇල්ලීමත්, සියුම් අංග චලනයක් සිදු කිරීමටත් යමෙකු පෙළඹීම හැක. එබැවින් ඒවායේ නියලෙන්නන් මෙන්ම අසන, දකින අයද ඒ අනූ ඇලීම ස්වභාවයයි. එහෙත් භික්ෂුවක සම්බන්ධයෙන් පිරිස්තර අයට උන්වහන්සේ පිළිබඳව ඇල්මක් ඇතිකර ගැනීම මෙන්ම තමන්ම එය ඇලීමද නොසේවන පිළිගොවිය ඉන්නකි.

සරභඤ්ඤයෙන් ධර්මය දේශනා කිරීමේදී හෝ පිරිත් සජ්ඣායනා කිරීමේදී ඒ සඳහා තමන් හෝ අනුන් විසල් වන්නේ නැත. එය අසන්නන්ගේ හෝ ගායකයන්ගේ නැත. සරභඤ්ඤයෙන් සිදුවන දේශනාවන් තුළින් ශ්‍රද්ධා සම්ප්‍රයුක්තව ධර්මය සන්නිවේදනය වීමක් පමණක් සිදුවේ.

- භික්ෂූන් වහන්සේ කවි, ගීත ගායනා කිරීම පුරුදු වූයේ ඇයි?

මහනුවර, සබරගමුව, බස් රටවල පමණක් නොවේ නැත හොයාන කොතැනක් ඇසෙන බණ සමතුන්ගේ ගායනාවක් ගීත තාලයේ අතිශයින් ජනප්‍රිය වී තිබේ. වාද්‍ය භාණ්ඩ තුළින් සංගීතයටද මුසුව ධර්මය ගායනා වන බවක් ශ්‍රාවකයාට හැඟී යයි.

මේ අතර සුප්‍රසිද්ධ ගීතවල තනුවලට ධර්මයෙන් වචන පෙළ ගළපා ගායනා කිරීම තුළද අසන්නාට ඇල්මක් ඇතිවීම නොවැළැක්විය හැකිය. පැවසෙන දේශ අරුතට ධර්මය පදනම් වී තිබුණද තනුව අසන් ගීතයේ ආභාෂය ඉස්මතු වෙමින් අර්ථය යටපත් වන බලයක් සිදුවේ. එබැවින් සිදුවන්නේ අසන්නා තුළින් ප්‍රඥව යටපත් වී භාවයන් ඉස්මතු වීමය. බුදුදහමට අනුව මෙය නොසේවන් යහපත් තත්ත්වයක් නොවේ.

'හද විල සැලෙන පෙම් පල රේඛා' නම් අපට ඇසෙන ප්‍රසිද්ධ ගීතයේ තනුවට සිදුවන දම් දෙසුම් පවා දැන් අසන්නට ලැබේ. ඒවා ප්‍රඥ මාර්ගයක් වන බුදුදහමට නොසේවත් එකක නොවන බව වෙසෙසින් කිව යුතුය. ඒ ගීතවත් බවට ඇලීම පෙර මී ආකාරයට ශ්‍රාවකයා තුළින් මෙවන් ගායනා කරන්නා තුළින්ද ඇතිවීම ස්වභාවිකය. එවැනි ඇල්මක් භික්ෂුවක් සම්බන්ධයෙන් සිදු නොවිය යුත්තක් නිසාම බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂුවක් ධර්මය තාලයකට අනුව ගායනා නොකළ යුතුය යන විනය නීතියක් පවා පනවා තිබේ.

මේ ආකාරයට භික්ෂූන් වහන්සේලා වාදනයක්ද සමඟ ධර්මය ගායනා කරද්දී සතුරු හෝ උන්වහන්සේ ඉදිරිපිට යම් අංගචලනයක් අභිනයක් නර්තනයේ යෙදුණද සාව හෝ දෙයක් නැතිය නොහැකිය. මේ නිසාද නර්තනයද ගායනය සහ වාදනය හා සෘජුවම බද්ධ වූ බැවිනි.

ගීත වාදනය සමග නෘත්‍යයද එකිනෙකට ඇදී පවතින බව බෞද්ධයන්ට රහසක් නොවේ.


- කවි බණද භික්ෂූන් වහන්සේට සුදුසුද?

කවි බණ යනු අප රට පරාධීනව පැවති මහනුවර යුගයේදී පමණ සාහිත්‍යමය සම්ප්‍රදායක් තුළ මිශ්‍ර ව්‍යාප්තියට හා ජනප්‍රියත්වයට පැමිණි අංගයකි. දවස පුරා කෙතේ කුඹුරේ වෙහෙස මහන්සි වන ගොවි ජනයාට සන්ධ්‍යා යාමයට පන්සලට, බණ මඩුවට එන්වීමට මේ කවි බණ උපකාරී වූ බව පෙනේ. එහෙත් ඒ කවියද බොහෝ විට ගැයුණේ ස්වර රටාවකින් තොරවය. මෙවැනිද අර්ථය යටපත්ව ශබ්ද රසය ඉස්මතු වන තරමට විය ප්‍රඥා මාර්ගයක් වන බුදුදහමින් බැහැර වන බව කිව යුතුය. තවත් සමහර භික්ෂූන් වහන්සේ ප්‍රසිද්ධ ගීතවල තාලයන්ට කවි ගායනා කරති. මිටකගේ කෙසෙසෙහ තොලබා යන ප්‍රසිද්ධ ගීතයේ තාලයට කවි බණක් දේශනා කරද්දී ඉස්මතු වන්නේ පෙර ගීතයේ ශබ්ද රසය මිස ධර්මයේ අර්ථ රසය නොවේ. ඒ තුළින් සිදුවන්නේ චිත්ත සමාධියට බාධාවකි. ඉන් අනතුරට පත්වීමක් සිදුවේ. අප මේවා ඉදිරිපත් කරනුයේ බොදු සමාජයේ යහපැවැත්ම උදෙසා නිහිගන්ද මේවා දැන සිටිය යුතු බැවිනි.

පූජ්‍ය හෑගොඩ විපස්සි හිමි



"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."



# ඔබටවත් අයිති නැති ඔබේ රුව

ලෝකයට ඇලීමට ජීවත් වෙන්නෝ සත්වයෝය. සත්වයා යනු රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකයට ආසක්තව, එනම් දැඩි සේ ඇල්මෙන් යුතුව ජීවත් වන්නන්ය. මේ සත්වයාගේ ස්වභාවය වන්නේ සැපට කැමති සහ දුකට අකමැති (සුඛකාමා දුක්ඛ පටික්කූලා) වීම බව බුද්ධ දේශනාවය.


ජීවත් වන සියලු සත්වයන් තම රූපයට ප්‍රිය වනු ඇත. තමන් ප්‍රිය කරන එම රූපය වෙනස් වීම සියලු සත්වයන්ගේ ආවේණික ලක්ෂණයයි. මෙය තිරිසන් සතුනට පවා උන් උන්ට ආවේණික ආකාරයට පවතියි.

විශේෂයෙන් මිනිසා යනු තම රූපයෙන් අතිශයින්ම සතුටට, උද්දාමයට පත්වීමට කැමැත්ත දක්වන සත්වයෙකු වේ. ඒ අතරින්ද කාන්තාව සුවිශේෂ ස්ථානයක් ගනී. බොහෝ කාන්තාවන් වෙන බොහෝ දේ නැතත් රූපය සුන්දරව තබාගන්නට උත්සාහවත් වන්නේ එබැවිනි.

බුද්ධධර්මයට අනුව රූපය යනු ඔබට, මට හෝ කිසිවෙකුට අයත් දෙයක් නොවේ. එය බුද්ධධර්මයේ "රූපං භික්ඛවේ න තුම්හාකං" යනුවෙන් සඳහන්ව ඇත. රූපය අපේ නොවන නිසා එහි ස්වභාවික වෙනස්වීම පාලනය කිරීම අපට කළ නොහැකිය. රූපය සැකසී තිබෙන්නේම වෙනස් වන මූල පදාර්ථයන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා ධාතූන්ගෙනි. එවන් රූපයක් වෙනසට ලක්වීම වළක්වාලිය නොහැකිය. රූපය වෙනස්වීම යනු රූපයටම ආවේණික වූ ස්වභාවයක් වේ. රූපය පිළිබඳ යථාර්ථය එයයි. යමෙක් මෙම යථාර්ථයට පිටුපා සියෙහොත් ඒ පුද්ගලයාට හිමිවන්නේ මානසික ආතතිය හා දුක්වේදනා පමණි.

මේකල බොහෝ කාන්තාවන් රූපාලංකරණය සඳහා විශාල වෙහෙසක් දරනු පෙනේ. රූපය අලංකාර කිරීමෙහි කිසිදු වරදක් නොමැත. එහෙත් එය අලංකාර කරන අවස්ථාවේම ඒ පිළිබඳ යථාර්ථයද දැනගැනීම ඉතාමත්ම අගනේය. කුසගින්නට ආහාර ගන්නා සේම, රෝගී වූ විට බෙහෙත් ගන්නා සේම, ගඳ නම් සුවඳ කරගන්නා සේම අවලක්ෂණ මකා ගන්නට අප කරන්නේ ලස්සන කිරීමය. තිබෙන රූපය ගැන සෑහීමට පත් නොවන විට එය වඩ වඩාත් සුන්දර කරගැනීමට පෙළඹෙනු ඇත.

බැලූ බැල්මට මෙහි වරදක්ද නොමැත. වරද ඇත්තේ එතැන නොවේ. ඒ ආකාරයට රූපය ලස්සන කරගැනීමට උත්සාහ දරන්නා එම ලස්සන සදාතනික යැයි සිතා වැළඳ ගැනීමය. එනම් වෙනස් නොවන තත්ත්වයක් පවතින බවට විශ්වාස කිරීමය. එසේ වූ විට සිදුවන්නේ අනිත්‍ය වූ රූපය වෙනස් වීමේදී එම වෙනස පිළිගන්නට තරම් ශක්තිමත් මනසක් නැතිව යාමයි.



බොහෝ දෙනා අනිසි අන්දමින් රූපාලංකරණයෙහි යෙදීමෙහි ප්‍රතිඵලය බොහෝවිට තිබෙන රූපයත් විකෘති කරගැනීමය. එහි ආනිශංස බාහිරව සිට බලන අයට පැහැදිලිව දිස්වනු ඇත. මයිකල් ජැක්සන් වැනි ලෝක ප්‍රකට පුද්ගලයන් තමාට උපතින් ලැබී තිබූ රූපයෙන් සෑහීමකට පත් නොවී එය වෙනස් කරගන්නට යාමේදී බොහෝ හිරිහැර සහ වේදනාවන්ට පත්වන්නට සිදුවූ බව ඔබ අසා ඇතැයි සිතමු.


රූපය කෙදිනක හෝ වෙනස්වීම එහි ආවේණික ස්වභාවයකි. වෙනස්වන රූපය නොවෙනස්ව එලෙසින්ම පවතින්නේ යයි විශ්වාස කිරීම සඤ්ඤා විපල්ලාසය ලෙස බුදුදහම දක්වයි. සඤ්ඤා විපල්ලාසයෙන් කටයුතු කරන නැතැත්තා මේ රූපයෙහි වෙනස, වෙනසක් ලෙස පිළිනොගෙන එය වෙනත් ක්‍රමයකින් පවත්වා ගන්නට උත්සාහවත් වෙයි. බොහෝ දෙනා එසේ කටයුතු කරන්නේ තමන්ගේ පවුල් පසුබිම, තමන්ගේ සාංස්කෘතිය වැනි දේ පවා අමතක කර දමමිනි. බොහෝ වයස්ගත කාන්තාවන් තරුණියන් හා සමව කටයුතු කරන්නට උත්සාහ කරන්නේත්, තරුණයන් හා උරෙනුර ගැටී කටයුතු කරන්නේත්, තරුණයන්ට වැඩියෙන් ප්‍රිය කරන්නේත් මෙම විපරීත මානසික තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙසිනි. එයින් සිදුවන්නේ එබඳු අයට සමාජයේ පිළිගැනීමක් ලැබීමට වඩා උසුළු විසුළුවලට ලක්වීමය.

මේ අනුව අපගේ අවසන් නිගමනය විය යුත්තේ රූපය කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක්වමින් එය ඔහේ පවතින්නට හැරීමක් නොවේ. රූපය ලස්සනට හා පිරිසිදුව තබා ගත යුතුය. එහි කිසිදු වාදයක් විවාදයක් නැත. නමුත් එය කෙදිනක හෝ වෙනස්වන රූපයක් බව දැන ඊට මුහුණ දෙන්නට සූදානමින් එය පරිහරණය කළ යුතුය. ධර්මයෙහි එය දක්වා තිබෙන්නේ "නිස්සරණ පඤ්ඤෝ පරිභුඤ්ජති" යනුවෙනි. එනම් අත හැරීමේ සූදානමින් පරිහරණය කිරීමයි.

මේ රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයම කෙදිනක හෝ අපට අත හරින්නට සිදුවේ. එය දැන රූපයෙහි අනිසි ලෙස නොඇලී ලස්සනට හා පිරිසිදුව සමාජයේ උසුළු විසුළුවලට ලක් නොවන සේ රූපය පරිහරණය කිරීම වඩාත් නුවණැති පියවර වෙයි.

පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



# අසිරිමත් මිහිඳු චරිතය

බුද්ධ වර්ෂ 236දී මිහිඳු මාහිමියන් පාලි ත්‍රිපිටකය හා එහි අටුවා රැගෙන ලක්දිවට වැඩම කළ බව ථෙරවාද සම්ප්‍රදාය මඟින් පිළිගනු ලැබ ඇත. දීපවංශය, මහාවංශය, සමන්තපාසාදිකාව ආදී ඓතිහාසික තොරතුරු සපයන පාලි මූලාශ්‍රයන්ගෙන්ද ඒ බව තහවුරු වේ. මහින්දාගමනයත් සමග ලාංකිකයන්ගේ සමාජ, ආගමික, දේශපාලනික, ආර්ථික, කලා ශිල්පීය ආදී සෑම ක්ෂේත්‍රයකම නව පිබිදීමක් උත්පාදනය විය. මේ නිසා මෙම සංස්කෘතිය මිහිඳු සංස්කෘතියක් බවට නිරායාසයෙන්ම පරිවර්තනය වූ ඉතා කෙටි කාලයක් තුළ බුදු දහමේ ආභාෂය තුළින් ලාංකික ජන ජීවිතය උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවූයේ මිහිඳු මාහිමියන් තුළ පැවැති අසීමිත දයානුකම්පාව හා අචංචල කැපවීම යන සාධක ද්විත්වය මූලික වීමෙනි. ඒ වගේම උන්වහන්සේ තුළ තිබූ කළමනාකාරීත්ව දක්ෂතාත් බෙහෙවින්ම මේ සඳහා ඉවහල් වූවාට සැක නැත.

නූතන කළමනාකරණ විග්‍රහයන් අනුව මිහිඳු හිමියන් මෙරට බුදු දහම ස්ථාපිත කිරීමට ගත් උත්සාහය යම් ව්‍යාපෘතියක් ලෙස අර්ථ දැක්විය හැකිය. එකී ව්‍යාපෘතියෙහි අග්‍ර කළමනාකරු ලෙස මිහිඳු මාහිමියන් හඳුන්වා දිය හැකිය. ඒ අනුව මිහිඳු චරිතයෙහි කළමනාකාරීත්වය දක්ෂතා රාශියක් දක ගත හැකි වේ. වසර 2316කට පෙර මිහිඳු චරිතයෙහි දක ගත හැකි එකී ලක්ෂණ නූතන කළමනාකරණ විද්වතුන්ගේ අර්ථ විග්‍රහයන් අනුව විමසා බැලීම මෙම ලිපියෙහි අරමුණයි.

අග්‍ර කළමනාකරුවන් විසින් පූර්ණ කළ යුතු කළමනාකාරීත්ව දක්ෂතා තුනක් රොබට් එල්. කට්ස් විසින් පෙන්වා දේ.

1. සංකල්පනාත්මක හෝ මනෝභාවාත්මක දක්ෂතා
2. මානව දක්ෂතා
3. ශිල්පීය දක්ෂතා

සංකල්පනාත්මක හෝ මනෝභාවාත්මක දක්ෂතා යනු යම් කාර්යයකදී මූලික වශයෙන් ඉදිරි දැක්ම පිළිබඳ හැකියාව හා විග්‍රහාත්මක හැකියාවන්ය. ඊට අමතරව යම් ආයතනයක තිබෙන විවිධ අංග, ඒවා අතර තිබෙන සම්බන්ධතාවයන් හා ඒවායේ එකතුව සමස්තයක් ලෙස දක්වීමට ඇති හැකියාවත්, ආයතනයකට එහි පරිසරයේ ඇති බලපෑමත් ඊට අනුව ආයතනය හැඩගැස්වීමට ඇති හැකියාවත්ය.

මේ හා සම්බන්ධව මිහිඳු හිමියන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අවධානය යොමු කරන විට උන්වහන්සේ තුළ මෙම දක්ෂතාවන් පැවැති බව දක ගත හැක. නව ප්‍රජාවකට නව්‍ය සංකල්පයක් හඳුන්වා දීමේදී අනුගමනය කළ යුතු පියවර ගණනාවක්ම උන්වහන්සේගේ ප්‍රයෝජනයට ගෙන ඇති බව පෙනේ. මූලිකව සංස්ථාවක් ලෙස බුදු දහම හඳුන්වා දෙන්නේ කවර පරිසරයක, කවර පුද්ගල පිරිසකටද යන්න හා ඒ පිරිස සතුව පවතින අදහස්, සාරධර්ම, සිරිත් විරිත්, ඇදහිලි මොනවාද යන්න සුවිශේෂී පෙර

විමසුම්ක නියැලී ඇති බව දැක ගත හැකිය.

**මිහිඳු හිමියන් ධර්ම දූතයකු ලෙස**

1. දෙවන පෑතිස් සමයේ ලක්දිවට පැමිණීම
2. ප්‍රථමයෙන් රටේ ප්‍රධාන පුරවැසියා වූ රජ මුණ ගැසීම
3. දහම් දෙසීමට පෙර රටේ ප්‍රධානියා සතු දැනුම පූර්ණ සම්මුඛ පරීක්ෂණයකට ලක් කිරීම හා ඒ අනුව එකල පැවැති දැනුම් මට්ටම වටහා ගැනීම
4. ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ නමක් කේන්ද්‍රගත කරගෙන විනය සංගායනාවක් පැවැත්වීම

ආදී ක්‍රියාකාරකම්වලින් විද්‍යාමාන වනුයේ ධර්මදූත කාර්යය පිළිබඳ ඉතා පැහැදිලි ඉදිරි දැක්මක් හා විග්‍රහාත්මක හැකියාවක් තිබූ බවයි.

දෙවන පෑතිස් වැනි තරුණ රජකුගේ රාජ්‍ය කාලය තුළ පැමිණීමෙන් මිහිඳු හිමියන් අපේක්ෂා කරන්නට ඇත්තේ තරුණ සිතුම් පැතුම් ඇත්තෙකු නව අදහස් ආකල්පවලට වැඩි නැඹුරුවක් දක්වන හෙයින් මුටසිව වැනි වෘද්ධ රජෙකුට වඩා තිස්ස රජු ඊට අතිශයින් උචිත බවකුයි. එමෙන්ම ප්‍රධාන පුරවැසියා යම් කාර්යයක් කෙරෙහි නැඹුරු කරගැනීම තුළින් රට වැසියන් ඒ කෙරෙහි යොමු කරවා ගැනීම ඉතා ඉහළ මනෝභාවාත්මක දක්ෂතාවක් තිබූ බවයි. තමන් හඳුන්වා දීමට උත්සාහ කරන දේ තේරුම් ගැනීමට හැකි විභව ශක්තියක් ප්‍රජාව තුළ තිබේදැයි විමසීම හොඳ කළමනාකරුවෙකුගේ ලක්ෂණයකි. ඒ අනුව තිස්ස රජුගේ දැනුම පරීක්ෂා කිරීමේ ක්‍රියාකාරකම තුළින් මිහිඳු හිමියන් වටහා ගැනීමට උත්සාහ කර ඇත්තේ නව සංකල්ප තේරුම්ගත හැකි පිරිසක් ලක්දිව තුළ සිටිද යන්නයි. විශේෂයෙන් යමෙකුගේ බුද්ධි මට්ටම වටහා ගත් විට ඒ අනුව කටයුතු කිරීම පහසු කාරණයක් වේ. ඒ පිළිබඳවද මිහිඳු හිමියන් අවධානය යොමුකර ඇත.

ඒ වගේම මිහිඳු හිමියන්ගේ මෙම ප්‍රකාශ කිහිප ආකාරයකින්ම වැදගත් වේ. ශාසනයේ ඉදිරි පැවැත්ම විනය තුළින් පැහැදිලි වීම එක් කරුණක් වන අතර අනික් කාරණය වන්නේ ශ්‍රී ලාංකික භික්ෂුවට සසුන පවරා දීමයි. එයද නව ව්‍යාපෘතියක් හඳුන්වා දීමෙන් පසු සිදුවන කළමනාකරණ ක්‍රියාවලියක මූලික අංගයකි. අදාළ ප්‍රජාවට, ව්‍යාපෘතිය පවරා එය පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම සකස් කරදීම දක්ෂ කළමනාකරුවෙකු සතු කාර්ය භාරයකි. මේ අනුව එම කළමනාකරණ ලක්ෂණය මිහිඳු චරිතය තුළින් මැනවින් දිස්වේ.

මිහිඳු හිමියන් තුළ පැවැති මානව දක්ෂතා ඉස්මතු වන්නේ උන්වහන්සේ ලාංකික සමාජයට තම ධර්මදූත කණ්ඩායම හඳුන්වාදීම හා ලාංකික ප්‍රජාවගේ හැසිරීම් රටා තේරුම් ගැනීම සහ ඔවුන් සමඟ අන්තර් සම්බන්ධතා පැවැත්වූ ආකාරය අනුවයි. තම කණ්ඩායම ලක්වැසියන්ට හඳුන්වා දීමේ ප්‍රයත්නයේදී මිහිඳු හිමියන් සතු මානව දක්ෂතා මෙන්ම මනෝභාවාත්මක




දක්ෂතාත් ප්‍රකට වේ. එද පැවැති ලාංකික සමාජ වාතාවරණය තුළ ලක්වැසියන් භික්ෂූන් වහන්සේ පිළිබඳ පූර්ව අත්දැකීමෙන් යුතු නොවීය. මේ නිසා මේ ආගන්තුක පිරිස දැකීමෙන් විස්මිත භාවයට පත්වන ලාංකිකයන් ඉන් මුදා ගැනීම පිණිස මිහිඳු හිමියන් භාවිත කළ උපක්‍රම වූයේ තමන් සමඟ ගිහි භවතෙකුද කැටුව ඒමයි. එයින් ගිහි හා පැවිදි සමාජ දෙක අතර ඇති වෙනස්කම් වටහා දීමට උත්සාහ ගෙන ඇත. සාමණේර සහ උපසම්පදා භික්ෂුව අතර වෙනස වටහා දීමට හා පැවිදි කිරීම හා උපසම්පදා අවබෝධයක් ලබාදීමටත්, භණ්ඩුක උපාසක පැවිදි කිරීමෙන් සාමණේරයන් උපසම්පදා කිරීම තුළින් සිදුකරන ලදී.

එයින් ගිහි ජනතාව තුළ පැවිදි වීමේ අභිලාෂය පිළිබඳ යම් පෙළඹීමක් ඇති කරන ලදී.

මිහිඳු හිමියන් දෙවන පෑතිස් රජු සමඟ පැවැත්වූ සම්බන්ධතා තුළින් උන්වහන්සේගේ මානව දක්ෂතා ප්‍රකට වේ. සෑම කාර්යයකදීම රජු අප්‍රසාදයට පත් නොවන අයුරින් පැහැදීම වඩාත් වර්ධනය වන අයුරින් ක්‍රියා කළ බව මහා උයන පූජා කිරීම, මෙහෙණි සසුන පිහිටුවීම, ථූපාරාමය නිර්මාණය කිරීම ආදී සංසිද්ධීන්ගෙන් හෙළිවේ. රජුගේ අභිසාධනය පිණිස තමාට හැකි සෑම උපකාරයකින්ම මිහිඳු හිමි රජුට අනුග්‍රහ කළ යුතු අතර රජද අභින් අතට ඒ අයුරින්ම හිමියන් වෙත අනුග්‍රහය පුදකර ඇත. එයින් ඔවුන් අතර සම්බන්ධතාව වඩාත් තීව්‍ර විය.

ලාංකික ප්‍රජාව අතර දහම් පණිවුඩය ප්‍රචලිත කිරීමේදී හිමියන් යොදාගත් ශිල්පීය දක්ෂතාද ඉතා ඉහළ මට්ටමක පැවතුණි. උන්වහන්සේ ධර්ම දේශනා කිරීමේදී ඒ බුද්ධි මට්ටම අනුව දේශනා පැවැත්වීම මෙහිදී කැපී පෙනේ. රාජකීයයන්ට උන්වහන්සේ ප්‍රථම වරට දේශනා කළේ චූලහත්ථිපදෝපම සූත්‍රයයි. මෙම සූත්‍රය තුළින් ත්‍රිවිධ රත්නය ගැන විශේෂයෙන් භික්ෂුවක් හා බුදු දහමේ මූලික ඉගැන්වීම

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. බියකුත් නැත."




පිළිබඳ තත්ත්වාවබෝධයක් ඇතිවුණි. අභිනවයෙන් බුදු දහම වැළඳ ගන්නා පිරිසකට ඉතාම යෝග්‍ය දේශනාවක් සේ මෙම සූත්‍රය හැඳින්විය හැක. මිහිඳු හිමියන් ගෙදර සිට රාජකීය කාන්තා පිරිස උදෙසා දේශනා කළේ විමානවත්ථු හා පේතවත්ථුවයි. මෙම විමාන පේත කතාවන්ගෙන් කියැවෙන්නේ කරන ලද හොඳ නරක කර්මයන්ගේ ප්‍රතිඵල විඳිමින් දිව්‍ය ලෝකයේ හා ප්‍රේත ලෝකයේ වාසය කරන ප්‍රාණීන් ගැනයි. එතරම් ගැඹුරු නොවන කාන්තා ප්‍රසාදය ජනිත වන සේ එවන පැවතුණු විශ්වාස කරන කොටගෙන බුදු දහම ගැන අවබෝධයක් ලබාදීමට මෙහිදී පියවර ගෙන ඇත.

ගස්, ගල්, පර්වත විශයෙහි පැවැත්වූ පුද පූජා වෙනුවට ශාරීරික, පාරිභෝගික, උද්දේශික ධාතූන් තැනූ ස්ථූපය, බෝධිය හා පිළිම වහන්සේ වන්දනා කිරීම හඳුන්වා දෙමින් විවිධ උපද්‍රව දුරිභූත කරනු සඳහා පැවැත්වූ යාතු කර්ම වැනි දෑ මගහරවා බුද්ධ, ධම්ම, සංඝ යන ගුණ ඇතුළත් වන ධර්ම දේශනා ක්‍රම පිළිබඳ භාවිතයට හුරු කරවන ලදී. මේ නව හඳුන්වා දීම් හැම එකක්ම මෙරට ජනතාවගේ පැරණි ක්‍රියාකාරකම්වලට සමගාමී වෙමින් නව සංකල්පනා යටතේ භික්ෂූන් වහන්සේගේ ශිල්පීය දක්ෂතා මෙන්ම සංකල්පනද පිළිබිඹු කරයි.

මේ අනුව විදේශීය ධර්මදූතයෙකු ලෙස නව චින්තන ක්‍රම හා භාවිත ක්‍රමවේදයක් නව සමාජයකට හඳුන්වා දීමට ක්‍රියා කළ අග්‍ර කළමනාකරුවෙක් ලෙසින්ද මිහිඳු හිමියන් හඳුන්වා දිය හැක.

පූජ්‍ය උඩුබද්දාවේ අස්සජි හිමි



# සාංඝික දේ පරිහරණය කිරීමෙන් පව් පිරේද?

බෞද්ධ අටුවා ග්‍රන්ථවල හා විමානවත්ථු, පේතවත්ථු වැනි කෘතිවල සඳහන් වන ආකාරයෙන් සංඝ සතු දේ පරිහරණය කිරීම ප්‍රේත මලු කපුටු ආදී කපුටු අත්බවයන් උරුමකරදෙන පාපකර්ම සේ පැවසේ.

නමුත් බොහෝ අය 'සාංඝික' යන්න නිසි හැටි වටහා නොගෙන තීරණවලට එළඹ පිළිවෙත් කටයුතු කරන ආකාරයක් දකිය හැකිය.

බුද්ධාගමට අනුව සාංඝික යන්න තෙආකාරයකට විස්තර කෙරේ.

1. එක දිවස
2 සත්තාහක
3 යාවජීව

එක දිවස යන සාංඝික කාණ්ඩයට අයත් වන්නේ දානමය ද්‍රව්‍යයන්ය. භික්ෂූන් වහන්සේට පූජා කරන දානයකින් උන්වහන්සේ වළඳා ඉතිරි වන කොටසක් ඇතිනම් ඉන් පසු තව දුරටත් සාංඝික ලෙස සලකන්නේ නැත.

සංඝගත දක්ෂිණාවක් පවත්වන විටදී සංඝයා වහන්සේට වැළඳීම පිණිස බුදු පිරුවටයකින් වසා ඇති දානමය දේ පමණක් සාංඝික දේ යැයි බොහෝ අය සලකති. එහෙත් එහිදී සංඝයා වහන්සේට වැළඳීමට පිළියෙළ කළ ආහාර පාන මෙන්ම උන්වහන්සේට පූජා කිරීම පිණිස ගත් සියලු දෙද මෙහිදී සාංඝික දේ ලෙස සලකනු ලබයි. බුදු පිරුවටයෙන් කැප කිරීම සංකේතාත්මකව සිදුවන්නකි.

සත්තාහක ලෙස සලකනුයේ ආහාරාදී දානමය වශයෙන් පූජා කොට දින හතක් ගත වන තුරු සාංඝික ලෙස සලකනු ලබන ද්‍රව්‍යයන්ය. ගිතෙල් වැනි දින කිහිපයක් තබාගත හැකි දේ ඒ කාලය පුරාවට සාංඝික දේ ලෙස සලකනු ලබයි. එලෙස සාංඝික වූ ආහාරාදිය භික්ෂූන් වහන්සේගේ අවසරයකින් තොරව භාවිතා කිරීම හේතුවෙන් සාංඝික දේ ආහාරයට ගැනීමේ පවට හවුල් කරුවෙකුවේ.

යාවජීව සාංඝිකය යනු විහාරාරාම, සංඝාවාස වැනි කාලාන්තරයක් පවතින දෑය. යාවජීව සාංඝික දේ කිසිකලෙක කිසිවෙකුටත් තම තමන්ගේ අභිමතය පරිදි අයිතිකර ගැනීමට හෝ හුවමාරු කිරීමට හැකියාවක් නැත.



"[illegible]"




# බෞද්ධ කොඩියේ උපත සිදු වූ හැටි



ශ්‍රී ලංකාද්වීපය නම් ධර්මද්වීපය බ්‍රිතාන්‍යයට යටත්ව පැවැති යුගයේ බෞද්ධ ජනතාවට විවිධ හිරිහැරවලට මුහුණ පෑමට සිදුවිය. ආගම ඇදහීමටවත් නිදහසක් නොතිබුණි. පෙරහැරක් පැවැත්වීමද තහනම් විය. මෙවැනි අවස්ථාවක ඉදිරිපත් වූ බෞද්ධ ජන නායකයන් බෞද්ධාරක්ෂක කමිටුවක් පිහිටුවා ගත්හ.

මෙම කමිටුවේ නිලධාරීන් ලෙස හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ උපදෙස් මත සභාපති ධුරය ධර්ම ගුණවර්ධන මුහන්දිරම් මහතාද, උප සභාපති, භාණ්ඩාගාරික , ලේකම් යන තනතුරු සඳහා දොන් කරෝලිස්, එච්.ඒ. ප්‍රනාන්දු හා සී.පී. ගුණවර්ධන යන මහත්වරු ඇතුළු කාරක සභාවක් පත්කර ගත්හ.

මෙම කමිටුවේ යෝජනා වර්තා යතාකොට සංදේශ මගින් ඕල්කට්තුමා විසින් එංගලන්තයේ යටත් විජිත භාර ඔහු ලේකම්වරයාට ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ අප භුක්ති විඳින නිදහස ලබා ගැනීමට හැකි වී තිබේ.

බෞද්ධ කොඩියක අවශ්‍යතාව පළමුව දැනුණු බෞද්ධාරක්ෂක කමිටුවේ සාමාජිකයෝ විවිධ සැලසුම් ඉදිරිපත් කළද සී.පී. ගුණවර්ධන තුමන් විසින් ඉදිරිපත් කරන ලද ෂඩ් වර්ණ බෞද්ධ රශ්මිය දක්වෙන කොඩියේ සැලසුම වඩා සුදුසු යැයි එහි සාමාජිකයන්ගේ අදහස විය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ පොහොසුල සංකේතවත් කරන සලකුණ ලෙස උන්වහන්සේට ගෞරවයක් ලෙසද බුදු රැස් නිමෙන වර්ණ 06 දිස්වන කොඩියක් එසවීමට සම්මත කළහ. බෞද්ධ කොඩියේ විස්තරය ප්‍රථමයෙන් ජනතාව අතරට ගෙන ගියේ 1985 අප්‍රේල් මස 17 වැනි දින නිකුත් වූ "සඳරැස" පත්‍රය මගින් "බෞද්ධයන් විසින් එසවත්නට ව්‍යවස්ථා කරගෙන තිබෙන කොඩියක්" යන ශීර්ෂ පාඨය යටතේ එම පුවත්පතේ පළ විය.

**බෞද්ධ කොඩියේ ෂඩ් වර්ණ**

බෝසතාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව හතරවැනි සතිය ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට වයඹ දිගින් පිහිටි රත්නඝර නැමැති විහාරයේ වැඩවසමින් පට්ඨාන ධර්මය නැමැති විහාරයේ වැඩවසමින් පට්ඨාන ධර්මය මෙනෙහි කරමින් සිටින විට සිය ශරීරයෙන් සවනක් රශ්මි මාලාවක් නික්මුණි. කේශාදිනීල ස්ථානවලින් නීල (නිල්) රශ්මියද, ඡවි (සම) ආදී ස්ථානවලින් පීත (කහ) රශ්මියද , මස් ලේ ආදියෙන් ලෝහිත




(රතු) රශ්මියද , අස්ථි හා දත්වලින් ඕදාත (සුදු) රශ්මියද නිකුත් වූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන්වේ. බුදුරදුන්ගේ ශරීරයෙන් සවනක් රැස් විහිදුවේ සෑදීම් බලයෙන් නොව පට්ඨාන ධර්මය මෙනෙහි කිරීමෙන් ලේ හා හෘදය ප්‍රසන්නවීමෙන් බව බුද්ධිමතුන්ගේ අදහස වේ.

ඕල්කට්තුමාගේ මතය වූයේ සම්මත ජාතික කොඩියේ ප්‍රමාණයට හා හැඩයට ගැළපෙන පරිදි බෞද්ධ කොඩියද සකස් විය යුතු බවයි. එම අදහසට අනුව 1886 දී ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය සකස් කළේය.

බෞද්ධ කොඩියේ නිර්මාතෘවරයා ලෙස ගෞරවය හිමි වූයේ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාට වුවද, එය තමාගේ නිර්මාණයක් නොවන බව එතුමා පවසා ඇත. ඒ අනුව බෞද්ධ කොඩියේ නිර්මාතෘවරයා බෞද්ධාරක්ෂක කමිටුවේ සිටිය සී.පී. ගුණවර්ධන මැතිතුමා බව පිළිගැනීමට සිදුවිය.

මෙම ධර්මද්වීපයේ ප්‍රථම වරට බෞද්ධ කොඩිය එසවන ලද්දේ 1885 අප්‍රේල් 28 වැනි දිනට යෙදුනු වෙසක් පුර පසළොස්වක පොහොය දිනයේය. මෙදින මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ ප්‍රධානත්වයෙන් කොටහේන දීපදුත්තමාරාමයේ දී ද හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන් විහාරයේ දීද, කැලණිය විහාරස්ථානය ඇතුළු ලංකාව පුරා තිබූ විහාරස්ථානවලද, සියලු බෞද්ධයෝ සිය නිවෙස්වලද බෞද්ධ ආයතනවලද බෞද්ධ ධජය එසවූහ.

දෙස් විදෙස් බුදු දහම ප්‍රචාරය කළ අනගාරික ධර්මපාලතුමා සේම ඕල්කට්තුමා වැනි ජාතික වීරයෝ බෞද්ධ කොඩියද විවිධ රටවල ව්‍යාප්ත කිරීමට පියවර ගත්හ. මුලින්ම ජපානයේ හා බුරුමයේ රාජ්‍ය නායකයන් මුණගැසී සාකච්ඡා කොට බෞද්ධයන් සංකේතවත් කිරීමට ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය භාවිතා කරන මෙන් ඉල්ලා සිටියහ. ඒ රටවල පාලකයෝ එම ඉල්ලීම පිළිගත්හ. මේ ආකාරයට තවත් බොහෝ රටවල බෞද්ධ කොඩිය ව්‍යාප්ත විය.

1950 මැයි 28 දින රටවල් 25ක නියෝජිතයන් 148 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මහනුවර පැවති ලෝක බෞද්ධ සම්මේලනයේ දී මහාචාර්ය ජී.පී. මලලසේකර මහතාගේ ඉල්ලීමක් වූයේ අපේ රටේ බෞද්ධ කොඩිය ලෝකයේම බෞද්ධ කොඩිය බව පිළිගන්නා ලෙසයි. ඒ සඳහා සියලු දෙනාගේ කැමැත්ත ලැබුණි. 1951 වසරේ සිට ශ්‍රී ලංකාවේ බෞද්ධ කොඩිය ලොව සියලුම බෞද්ධ ජනතාවගේ ආගමික කොඩිය බවට පත්විය.

**පූජ්‍ය ඇරංගල මංගල හිමි**


"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ වැඩසටහන් කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

## සදහම් දිවයින යළි ගොඩනගමු





# මිහිඳු හිමියනි...

## ඔබ මෙහි නොවැඩියේ නම්...?




'අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිද්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)

# ධම්මධජ ජාතකයෙන් හෙළිවන

## යුක්තිය අයුක්තිය කොට, නිවැරදිකරුවන් වැරදි කොට

# දැක්වීමේ විපාක



අසමසම වූ තිලොවට තිලක වූ තිහුවන පූජාමාණිකා වූ තිලෝගුරු අප සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සමයෙහි දේවදත්ත තෙරුන් බුදුන්වහන්සේ වධහිංසාවට පැමිණවීමට උත්සාහ කළ ආකාරයන් පිළිබඳව කතිකා කරමින් සිටි සංඝ සභා මණ්ඩපයට වැඩ වදාළ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, පෙර කිනම් කතාවක් කරමින් සිටියේද" යි විචාරා ඔවුන් කතිකා කරමින් සිටි දේ විමසා අසා "මහණෙනි, දැන් පමණක් නොව දේවදත්තයන් මීට පළමු මා වදයට පැමිණවීමට උත්සාහ කොටත් [illegible] අහිමිකිරීමට පොළොඹවන්නට වූයේය" යැයි වදාළ සේක. මහසඟුන් ඒ කෙසේදැයි විමසීමෙන් [illegible] මෙම අතීත කතාව ගෙනහැර දැක්වූ සේක.

පෙර දවසයි බරණැස් නුවර යුග්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි රජුට කාළ නම් සෙනෙවියක් කෙනෙක් සිටියේය. ඡත්තපාණි නම් මඟුල් කපුවෙකුත් සිටියේය. පුරණ ලද පාරමිතා ඇති බෝධිසත්වයන් වහන්සේ රජුගේ පුරෝහිත තනතුරේ සිටියහ. නමින් ධම්මධජ පණ්ඩිත නම් වූහ. එකල්හි කාළනම් සෙනෙවියා අධිකරණ කටයුතු විභාගකරනවිට ලෙස අල්ලස් ගනිමින් හිමියන් අහිමියන් කොට යුක්තිය අයුක්තිය කොට කටයුතු කළේය. එක් දිනක් අයුක්තියක් විඳගත් පුරුෂයෙක් පිරිසක් අධිකරණයෙන් පැරදී බෝධිසත්වයන් එන පෙරමගට ගොස් අඬ අඬා ස්වාමීනි, කාළ නම් සෙනෙවියන් යුක්තිය අයුක්තිය කොට අල්ලස් ගෙන බොහෝ අපරාධයන් කරන්නාහ. ඔබ වැනි ධර්මිෂ්ඨ අමාත්‍යයෙක් සිටියදී අපට සිදුවූ අසාධාරණය විමසා නොබලන්නේදැයි ඇසූහ." බෝධිසත්වයෝ එපවත් අසා යහපත් ලෙස විභාගකිරීම කියා ඔවුන්

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"



කැඳවාගෙන අධිකරණ ශාලාවට ගොස් යුක්තිය වූ පසිඳලන්නට විචාරා හිමියන්ට , හිමිකම් ලබාදුන්හ. යුක්තිය දැකුමින් සෙමෙන් විචාළහ. මෙසේ දැකුමින් සෙමෙන් විචාළ බව දැනගත් මිනිසුන්ගේ බොහෝ සාධුකාර දී යහපත් ලෙස යුක්තිය විචාළ බව කියා ඝෝෂා කළහ. රජු ඒ ඝෝෂාව කුමක්දැයි විමසූ විට එම ඝෝෂාව නම් පුරෝහිත බමුණා විසින් , කාල නම් සෙනෙවිරත් දුන් වැරදි තීන්දුව පිළිබඳව කරන ලද විනිශ්චය එයට හේතුව බව දැනගත්තේය. එවිට රජු පුරෝහිත බමුණාට ඉදිරියේ දී ඔබම අධිකරණය විචාරන්නැයි බෝධිසත්වයන්ගෙන් ඉල්ලා සිටියේය.

එතැන් පටන් හිමියන් හිමි කොට අහිමියන් අහිමි කොට මැදහත්ව බෝධිසත්වයන් නිසිය විසඳූ බැවින් කාල නම් සෙනෙවියාට ලැබෙන අල්ලස් නැතිව ගියේය. එවිට කිපුණු කාල නම් සෙනෙවිරත් පුරෝහිතයන් රජු කෙරෙහි බිඳවා හැසිය යුතුය සිතා, රජතුමාට , ධර්මධ්වජ පණ්ඩිතයා නුඹවහන්සේගේ රාජ්‍යය ප්‍රාර්ථනා කරමින් කටයුතු කරන්නේ" යැයි අසත්‍ය යකුවක් කීහ. රජතුමන් ඒ බස් අසා පසුද බෝසතුන් එන දෙස බලා සිටිද්දී ජනතාව බැහුට දක්වන සැලකිලි දෙස බලා , කාල නම් සෙනෙවියා කී බස සැබෑවක් යැයි සිතා මොහුට කුමක් කරන්නෙම්දැයි සෙනෙවිරත්ගෙන් විමසීය. එවිට පුරෝහිතයන්ට කළ නොහැකි වැඩක් පවරා ඒ වරදට මරණ දඬුවම පමුණුවන්නැයි කීය. රජතුමා සෙනෙවියාගේ උපදෙස් පරිදි, හෙට දිනයේ අලුත් උයනක් සකස් කරවා, එක් දවසකින් නිමවා දෙන ලෙසටත්, එය නොකළ හොත් මරණ දඬුවම පමුණුවන බවටත් නියම කරන්නැයි දන්විය. රජතුමා ධර්මධ්වජ පණ්ඩිතයන් කැඳවා තමන්ට උයන් කෙළිනා පිණිස අලුත් උයනක් කරවා පාවා දෙන්නැයි කීය. හෙට එන වේලාවට එය කරගත නොහැකි වුව හොත් ඔබේ ජීවිතයට හානි පැමිණෙන්නැයි ද දන්විය.

බෝධිසත්වයන් මේ කාල නම් සෙනෙවියාගේ උපක්‍රමයක් බව සිතා, නිවසට ගොස් හිස් සෝද හා ආහාර ගෙන වික්ෂෝපයෙන් සිටියේය. එකල්හි බෝධිසත්වයන්ගේ ගුණානුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණු විය. සක්දෙවිරජු මිනිස් ලොව දෙස බලා බෝධිසත්වයන්වහන්සේගේ ගෙය සමීපයේ අහසයේ පෙනී සිටියේය. බෝධිසත්වයෙනි ඔබ කවරෙක් දැයි විමසූ විට මම ඔබගේ ගුණානුභාවයෙන් ආවෙමි. වික්ෂෝපයෙන් සිටීමට කාරණය කුමක්දැයි විමසා දැන , නන්ද නම් උයන වැනි උයනක් නිර්මාණය කොට බෝධිසත්වයන්ට දන්වූහ. බෝධිසත්වයෝ පසුද උදෑසන රජතුමාට උයන කළ බව දන්වා පෙන්වූ විට රජු පුදුමයට පත්විය.

එවිට කාල නම් සෙනෙවියා නැවත පටිපුමින් සැලසූ සත්රුවන්මය පොකුණක් නිර්මාණය කරවා ගන්නැයි රජුගෙන් ඉල්ලා බෝධිසත්වයන් සක්දෙවිරජුගේ අනුහසින් පොකුණ ද නිර්මාණය කොට නිමා විය. එය ද දුටු රජතුමා දැන් කුමක් කරන්නේ දැයි සිතා, සෙනෙවියාගෙන් ඇසූ විට සඳුඳිනට මනහර මාළිගයක් කරවා දෙන මෙන් දන්වන ලෙසත්, එසේ නොහැකි නම් මරණය හිමි වන බවත් දන්වන ලෙස කියා සිටියේය. බෝධිසත්වයන් එයද කරවා නිමවූ පසු , දැන් කුමක් කරම්දැයි සෙනෙවියාගෙන් ඇසූ විට, මාළිගාවට යෝග්‍ය නොඇල්වා මාණික්‍යයෙන් බබළන ආකාරයට උතුම් මැණිකක් මවන්නට කියන්න යැයි ඉල්ලා සිටියහ. එවිට ශක්‍රයා මාණික්‍යමය ආලෝකයක් නිර්මිත කළේය.

ඉන්පසු රජතුමා සෙනෙවිරත් ගෙන් විමසූ විට, මෙය දේවානුභාවයෙන් කෙරෙන දෙයකි. එබැවින් දෙවියන් වහන්සේට කරන්නට නොහැකි දෙයක් පවසමු යි කියා චතුරංගයෙන් යුතු උද්‍යාන පාලකයෙකු මවන්න යැයි ඉල්ලා සිටින මෙන් කීවේය. මෙසේ අවස්ථා කීපයකදීම සක්දෙවි ලවා යම් යම් දේ නිර්මාණය කරවා දිවි ගලවා ගත් බෝධිසත්වයෝ මෙවර අසරණව මිය යාම් යහපතැයි සිතා කාටවත් නොදන්වා ප්‍රාසාදයෙන් බිමට බැස වනයට ගොස් "ලාභො අලාභො අයසො යසොච නින්දා පසංසාච සුඛංච දුක්ඛං" යන මේ අෂ්ටලෝකධර්මය සිහිපත් කරමින් ගසක් මුල සිටියහ. එවිට ශක්‍ර දේවේන්ද්‍රයා වැදි පුරුෂයකුගේ වේශයෙන් පැමිණ විමසූ විට චතුරංගයෙන් යුක්ත මිනිසෙකු මවන්නට කී බව දැන රජුගේ ඡත්තපාණි නම් මිණුල් කපුවා චතුරංගයෙන් යුක්ත බැවින් ඔහු රජුට ඉදිරිපත් කොට උයන්ගොව්කමට පත්කරවා ගන්න යැයි කීහ.

බෝධිසත්වයෝ පසුද ඡත්තපාණි නම් කපුවා දැක, එම්බල ඡත්තපාණිය ඔබ චතුරංගයෙන් යුක්තදැයි විමසා සිටියේය. තමන් චතුරංගයෙන් යුක්ත බව දන්නුයේ කවුදැයි විමසා, ශක්‍ර දේවේන්ද්‍රයා බව දන්වූ විට , එසේය , මම චතුරංගයෙන් යුක්ත යැයි ඔහු පැවසීය. එවිට ඔහු සමග ගිය බෝධිසත්වයෝ රජතුමනි, මොහු චතුරංගයෙන් යුක්තය. මොහු උයන්ගොව්කමට පත්කරන ලෙස

ඉල්ලීමක් කළේය. එවිට රජතුමා තමන් චතුරංගයෙන් යුක්තදැයි ඔහුගෙන් විමසූ විට එය හැඹිවන් යැයි පැවසීය. එසේ නම් මගේ චතුරංගය කුමක්දැයි පවසන්න යැයි දන්විය.

අනුන් කෙරෙහි වෛරයක් ද්වේෂයක් නොකිරීමය, මද්‍යපාන නොකිරීමය, අවිඥානික, සවිඥානික සියල්ලන් කෙරෙහි ඇල්ම නොකිරීමය, මෛත්‍රී භාවනාව කිරීමය යන සතර චතුරංගය යැයි කීය. එවිට රජු සියල්ලෝම යම් යම් හේතුව අනුන් කෙරෙහි වෛර කරන්නාහ. ඔබ එසේ වෛර නොකරන්නේ කවර අරමුණක් නිසාදැයි විමසීය. එවිට මම පෙර රජව ඉපිද බිසොවුන්ගේ බස් අසා පුරෝහිත බමුණා මරවනයට පැමිණෙව්මි. එනැත් පටන් මා ද්වේෂය අත්හළේ යැයි කීය. මම බුද්ධදත්ත රජුව ඉපිද ගමනක් යන විට බිසොවුන්ගේ සැප පහසු විචාරා සූසැට වරක් මෙහෙ කරන්නන් යැව්මි. උන් හැම සමග බිසොවුන් අනාචාරයේ යෙදී, අවසානයේ පුරෝහිත බමුණා අත අල්ලාපු සැනින් මම එසේ වූ දෙයක් නොකරමිකි කියා පලා ගියේය. ඔහුට මහු කෙරෙහි වෛර බැඳ බමුණා සමග පොරොන්දුවකට බැඳෙන්නට සිදුවුණැයි සිතා බමුණාගෙන්

පිළිගැනීමට රජුට බොරු මුසාබස් කියා බමුණා තමන් කෙරෙහි වෛර බැඳගෙන වරද භාරගන්නට සිදුවුණැයි කීවාය. රජු එය ඇත්තැයි සිතා බමුණා පිටුපල හයා බැඳගෙන විත් කරුණු විමසූ විට බමුණා මම එසේ නොකළ බව දන්වීය. නියම තත්ත්වය දැනගත් රජු බිසොවුන් කෙරෙහි කිපුණාහ. පුරෝහිත බමුණා, දෙවියන්වහන්ස, දේවීන්වහන්සේට නොකිපුණ මැනව. ස්ත්‍රීන්ගේ ස්වභාවය මෙයැයි, එමත් ඇසූ මෙන් , ඒ ජාතියේ බමුණා කී බස් අසා, මේ ජාතියේ පටන් නිවන් දකිනා තෙක් කවුරුන් කෙරෙහිවත් ක්‍රෝධ නොකරමියි අධිෂ්ඨාන කළෙමි. එම නිසා මං කා කෙරෙහිවත් ද්වේෂයක් නැත්තෙමි.

ඉන්පසු මද්‍යපාන නොකරන්නේ කුමක් නිසාදැයි විමසීය. පෙර මම රජව ඉපිදුනිය පුතුගෙන් මාංශය රා බොනයන් කෑවෙමි. එනැත් පටන් මා රා බීම අත්හළෙමි. පෙර මම මේ රටෙහිම ජන්තපාහි නම් රජව ඉපිද මස්මාංශ ඇනුව මිසක් බත් නොකෑවෙමි. එක් දවසක් අරක්කැමියා පොහොය දවස් පෙරදු බැවින් ප්‍රාණඝාතය කරන්නට බැරි යයි කියා පළමුවම මස් අරගෙන තබා ගත්තේය. එම මස් බල්ලා කා ගියේය. එවිට අක්කැමියා රජුට ආහාර සුදානම් කරන්නට හයින් බිසොවුන්ට දේවියන්වහන්ස , රජුට තිබූ මස් බල්ලා කා ගිය බැවින් මස් නැතිව ආහාර පිසීමට සිදුවිය. නිකම් බත් සුදානම් කරන්නට හය බව දන්වීය. එවිට බිසව මම එයට බිය නොවන්න. ඊට උපායක් තියෙනී. රජු මාගේ පුතනුවන්ට බලවත් ස්නේහ ඇත්තේය. එසේ හෙයින් මම බත්කන වේලාව බලා, මගේ පුතනුවන් සතපා උකුලෙහි තබමි. රජු පුතණුවන් සතපා සනසා බත් කන විට දඩ මස් නොවූ බවත් නොදන බත් කනු ඇත. අරක්කැමියාත් ඒ උපදෙස් පරිදි කටයුතු කළේය. රජු රා බී මත්ව බත් කන විට දඩමස් නොදක ඇයි දයි විචාළේය. ස්වාමිනී , අරත් තිබූ මස් බල්ලෝ කෑව නිසා පෝයට විදියේ මස් නොලද්දෙමි. එවිට රජු මටත් මස් සායක් තිබුණාට මට එය සෑහෙන් නොවේ යයි කියා ඇකයේ සිටි රාජ කුමාරයාගේ බෙල්ලට මිරිකා, මේ මස් මස් පිස ගෙනවයි අරක්කැමියා කීය. එතුත් යහපතැයි කියා, ඒ මස් පිස රජුට ආහාරයට දුන්නේය. ඇම්බියෝත් රජුට හයින් මේ බව නොදන්වුහ. රජතුමා මස් අනුභව කොට නිදා සිටියේය. ඒ වේලාවේ රා මදය සිඳී ගොස් තිබුණු බැවින් මගේ පුතා මෙහි ගෙන එන්නැයි කීය. එවිට බිසව රජුගේ පාමුල වැටී අඬමින් ඔබ පුතාගේ මාංශය කෑවේ යයි දන්වූවාය. එදා පටන් නිවන් දකිනා තෙක් දක්වා රා නොබොමියි අධිෂ්ඨාන කළෙමි.

" මෙම ධම්මද්ධජ ජාතකය තුළින් අනුන්ගේ කුරිරු බොරු බස් අසා හිමියන් අහිමි කොට, යුක්තිය අයුක්තිය කොට, නිවැරදිකරුවන් වැරදි කොට දැක්වීමෙහි විපාක මැනවින් හඳුනාගෙන, හරි දෙය හරි ලෙසත්, වැරදි දෙය වැරදි ලෙසත්, යුක්තිය යුක්තිය ලෙසත්, හිමියා හිමියා ලෙසත් මනාව දැන හඳුනාගෙන කටයුතු කිරීමෙන් ලද හැකි සුගතිය, යහපත වටහාගෙන, ධම්මද්ධජ පණ්ඩිතයා මෙන් අපගේ ද චරිතයන් සකසා ගැනීමට උත්සුක වීමට අදිටන් කර ගනිමු. "

අනතුරුව තොප කා කෙරෙහිත් ඇල්මක් නොදක්වන්නේ ඇයිදැයි විචාළේය. එවිට ජන්තපාහි නමුවා මා පසේ බුදුන්ගේ පාත්‍රය බිඳ අවීචි මහා නරකයේ පැසුණු කෙනෙකුන්ට එය රජුව සිට බොහෝ දුක් වින්දෙමි. එනැත් පටන් එක්කෙනෙකු කෙරෙහිවත් ඇල්මක් නොකර සිටියෙමි. අතීතයේ මේ නුවරම කීතවාස නම් රජව උපන්නෙමි. මේ රජුට එක් පුතෙකු උපන්නේය. බ්‍රාහ්මණයෝ මේ රාජ කුමාරයා යම් දවසක පැන් නොලැබ මිය යන්නේ යැයි කීහ. එය ඇසූ රජතුමා සතරවාසල මහා වැව් සතරක් බන්දවා ඇතුළ් නුවර ඒ ඒ තැන පොකුණු බඳවා අම්බලම් තනවා පැන් තබවා දවස් ගතකළහ. රාජ කුමාරයාත් වැඩිවිය පැමිණ යුවරජ තනතුරු ලැබ දුෂ්ඨ රාජ කුමාරයා යැයි ප්‍රසිද්ධ විය. රජු තම අඹුදරුවන් යන හැම තැනටම කැඳවාගෙන ගියහ. එක් දවසක් දුෂ්ඨ රාජ කුමාරයා තනිව ඇවිදින්නට ගියේය, ඒ වේලාවට සිල්වත් එක් පසේ බුදුන් කෙනෙක් බත් පාත්‍රයක් සිඟාගෙන වීදියෙහි වඩිමින් සිටියහ. ඒ වේලාවෙහි රජු සමග ගමන් කළ බොහෝ දෙනා පසේබුදුන්ට වඳින්නට පටන් ගත්හ. එවිට මා වැනි රාජ කුමාරයෙක් සමග සිටියදී මේ මුඩු කළ භික්ෂුන් දකින්නට යෙදුණේ යැයි කිපී, පසේබුදුන් කරා ගොස් , පාත්‍රයට බත් ලද්දේ දැයි අසා, පාත්‍රය අතට ගෙන බිමට විසි කොට පයින් සුණු විසුණු කළහ. පසේබුදුන් , නිෂ්කාරණේ මෙතෙම මගේ පාත්‍රය බිඳ බොහෝ අකුසල් සිදුකර ගත්තේ යැයි සිතා මුහුණ බැලූහ. එවිට කුමාරයා උරණ වී මුහුණ බැලුවේ යැයි සිතා, කුමාරයා පසේබුදුන්ගෙන් ඔබ මට උරණව කරන්නේ කුමක්දැයි විමසූ විට, පසේ බුදුන් ආහාර නොලැබීව උත්තරාපථයෙහි නන්දමූල පර්වතයට වැඩි සේක. ඒ වේලාවට අවීචි මහා නරකයේ ගිනිදැල් ඇවිත් කුමාරයාගේ ඇඟ ගිනිගත්තේ පිපාසයට පැන් ගෙනවයි කීහ. ඒ වේලාවට තිබූ වැව් පොකුණුවල පැන් සිඳී ගොස්ය. පොළොව පළාගෙන කුමාරයා අවීචි නරකයට අරගෙන ගියේය. රජව උපන් මම බොහෝ චිත්තපීඩයට පැමිණ යමකට ඇල්ම කිරීමෙන් සිද, චිත්තපීඩාද උපදින්නේය. එබැවින් මේ ජාතියේ පටන් නිවන් දක්නා ජාති දක්වා කිසි වස්තුවකට ඇල්මක් නොකරමියි අධිෂ්ඨාන කළෙමි.

එවිට සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී කරන්නේ ඇයි දැයි විමසූ විට, තාපස ඇති කළාවූ මෛත්‍රී භාවනා අභ්‍යාසයෙන් මේ ජාතියේ මෛත්‍රී ඇත්තෙමැයි කීය. මේ නුවර අරක නම් තාපසව ඉපිද මෛත්‍රී භාවනාව කොට බ්‍රහ්මලොව ඉපිද සත් කපක් මෛත්‍රී භාවනාව කොට බ්‍රහ්මලොව ඉපිද ඒ අභ්‍යාසයෙන් දැනුත් මා මෛත්‍රී ආනුභාව ඇත්තෙමි.

එවිට රජු අපරාධයක් නොකළ ධම්මද්ධජ පණ්ඩිතයන් කෙරෙහි මේ කාල නම් සෙනෙවියා අල්ලස් ගැනීමේ චේතනාවෙන් මේ සියල්ල ඉඩු කළේ යැයි කෝපව අමාත්‍යයන්ගේ මුහුණ බැලූ විට, ඔබ නිරපරාදේ ධම්මද්ධජ පණ්ඩිතයන් නැසීමට උත්සාහ කළේ යයි කියා ඔහු හෙළා බොහෝ දෙනා කැට මුගුරු ගෙන තලා නුවරින් පිටත කසළ ගොඩට දැමීමේ යැයි ධම්මද්ධජ ජාතකය නිමවා වදළ සේක. එසමයෙහි කාල නම් සෙනෙවියා දේවදත්ත ස්ථවිරයෝය, ධම්මද්ධජ පණ්ඩිත නම් බුදු වූ මමමයි දේශනා කොට වදාළ සේක.

මෙම ධම්මද්ධජ ජාතකය තුළින් අනුන්ගේ කුරිරු බොරු බස් අසා හිමියන් අහිමි කොට, යුක්තිය අයුක්තිය කොට, නිවැරදිකරුවන් වැරදි කොට දැක්වීමෙහි විපාක මැනවින් හඳුනාගෙන, හරි දෙය හරි ලෙසත්, වැරදි දෙය වැරදි ලෙසත්, යුක්තිය යුක්තිය ලෙසත්, හිමියා හිමියා ලෙසත් මනාව දැන හඳුනාගෙන කටයුතු කිරීමෙන් ලද හැකි සුගතිය, යහපත වටහාගෙන, ධම්මද්ධජ පණ්ඩිතයා මෙන් අපගේ ද චරිතයන් සකසා ගැනීමට උත්සුක වීමට අදිටන් කර ගනිමු.

**ජේ. මිගහකුඹුර**



# බුද්ධ පූජාව තැබිය යුත්තේ මේ ගැනත් දැනගෙනයි

බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් නිතිපතා බුද්ධ පූජාව තැබීම පුරුද්දක් කරගත් බෞද්ධයෝ බොහෝ සිටිති. නමුත් එලෙස බුද්ධ පූජාව තැබීම සම්බන්ධයෙන් පවතින මතිමතාන්තර බොහෝය. ඒ අතර සමහර පුද්ගලයන් අචේතනික, අප්‍රාණික වස්තුවක් ඉදිරියේ සජීවී මිනිසෙකු ආහාරයක් තැබීම කොතරම් යුතු ගෝචරදැයි ප්‍රශ්න කරන අවස්ථා ද තිබේ.

මෙහිදී අප පළමුව බුද්ධිය හා ශ්‍රද්ධාව අතර පවතින වෙනස හඳුනාගත යුතුය. බුද්ධිය යනු යමක් දෙස නිරීක්ෂණාත්මකව සුවිශේෂී ආකාරයට දකිමට හැකි ඥානයයි. නමුත් ඒ දෙකම නොයෙක් ඇතිකඩවල් තුළින් ඉතා පුළුල්ව හා සාධාරණ ලෙස දකිය යුතුවයි. කවර ආකාරයකට පවසනවා නම් ශ්‍රද්ධාව යනු සියලු අනට විසිර පැතිරිය ඥානය ලෙස විග්‍රහ කළ හැකිය. බුද්ධ පූජාව තැබීම සම්බන්ධයෙන්ද පැවැතිය යුතු වන්නේ එයමය. මෙහිදී බුද්ධ පූජාව තබන ප්‍රතිමාව තුමන මුලද්‍රව්‍යයකින් තැනුවද ඉන් සංකේතවත් වන්නේ අනන්ලෝකග්‍ය බුදුපියාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණයයි.

සියලු සතුන්ගේ දිවි රැක ගැනීමට ආහාරය අනිවාර්යය. ඒ දෙයින් අග්‍ර භාගය නව අරහාදී බුදුගුණ වෙනුවෙන් පූජා කිරීම තුළ ඉතා ගැඹුරු වූ ආධ්‍යාත්මික හා සදාචාරාත්මක මෙන්ම දාර්ශනික හරයක්ද තිබේ. එය හොඳින්වාදී දෘෂ්ටියකින් තොරව දාර්ශනිකව දකිය යුත්තකි. එය වටහා ගැනීම කළ හැක්කේ ප්‍රඥාවන්තයන්ට පමණක් බවද පැවැතිය යුතු වේ.

## බුද්ධ පූජාව තැබීම බුද්ධ ප්‍රතිමාවේ ප්‍රමාණය හා සැසඳිය යුතුද?

බුද්ධ පූජාව තැබීම සම්බන්ධයෙන් සමාජයීය මට්ටමින් සිදු කෙරෙන විද විවාදවලදී එබඳු බොහෝ අදහස් අසාගතු දකිය හැක. අඟල් කිහිපයක් උස කුඩා ප්‍රමාණයේ ප්‍රතිමාවක් සඳහා ලොකු ප්‍රමාණයේ ආහාර බඳුනක් තැබීම සහ අඩිගණන් වැනි ප්‍රවිසල් බුද්ධ ප්‍රතිමාවක් සඳහා කුඩා පැන් බඳුනක් පූජා කිරීම තර්කානුකූල නොවන බව පවසන්නෝ ද වෙති. එහෙත් මෙය භෞතික සහ තාර්කික ප්‍රවේශයක් මගින් විසඳිය යුතු පැනයක් නොවේ. එබැවින් ඒ සම්බන්ධයෙන් අප පහත දක්වෙන කරුණු පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

1. අප බුද්ධ පූජාව පුදනුයේ බුදු රජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණයට මිස බුද්ධ ප්‍රතිමාව නම් වන ද්‍රව්‍යමය පදාර්ථයට නොවේ.

2. බුද්ධ පූජාව වශයෙන් අප පූජා කරනුයේ මිනිසුන් ඇතුළු සියලු සතුන්ගේ ජීවත් වීමට ඉවහල් වන ප්‍රධානතම බලවේගයේ අග්‍රභාගය පිළිබඳ සංකේතාත්මක දෙයක් මිස බත්, පාන්, රොටි ආදී ද්‍රව්‍යමය දෙයක් නොවේ.

3. එසේ පූජා කරන බුද්ධ පූජාව බුදුරජාණන් වහන්සේ විසින් වළඳන බවක් හෝ නාස්තිම බලයකින් එම ආහාර අඩුවන බවක් කිසිදු බෞද්ධයෙක් විශ්වාස නොකරති. බුද්ධ පූජාව තැබීම සම්බන්ධයෙන් එහි ප්‍රමාණය පිළිබඳව බෞද්ධයන් තැකීමක් නොකරන්නේ නොකළ යුත්තක් හෙයිනි.



## බුද්ධ පූජාව තැබීමේ අනුසස්

ප්‍රඥාවන්ත සහ දාර්ශනික පසුතලයක් යටතේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් තමන් විසින් පිළියෙළ කරගත් ආහාරයේ අග්‍ර කොටස් බුද්ධ පූජාව වශයෙන් පිරිනැමීමේ ඇති වැදගත්කම පසු මුලින් පැවැසුවෙමු. මෙහිදී බුද්ධ පූජාව තැබීමෙන් දාන, සීල, භාවනාදී කුසලකර්මයන් වැඩීම නිරායාසයෙන්ම සිදු වන්නකි. නව අරහාදී බුදුගුණ මෙනෙහි වීම තුළින් සිතෙහි පැවැති අපුල් ලිහි පිරිසිදු බව ඇතිවීම, පවුලේ අන් අය කෙරෙහි මෙන්ම සියලු සත්වයන් කෙරෙහි ද මෛත්‍රී සිතුවිලි වර්ධනය වීම නිතැතින්ම සිදුවේ.

"මනුස්සානං පියෝ හෝති
අමනුස්සානං පියෝ හෝති"

යන බුදු වදනින් පැවසෙන ආකාරයට එලෙස සිල් රකින, මෙත් වඩන අය කෙරෙහි මිනිසුන් ද නොමිනිසුන්ද ප්‍රිය වන බව පැවසේ. ඒ අනුව එක් පුද්ගලයන්ගේ ගෘහස්ථ ජීවිතය පවුලේ එකිනෙකා අතර සුහදතාවය වැඩි වර්ධනය වීම සිදුවේ. මිනිසුන්ගේ චිත්ත අභ්‍යන්තරය ප්‍රසන්න වන විට බාහිර ස්වරූපය හා වටාපිටාව ජීවත් වන පරිසරයද ප්‍රසන්න බවට නිරායාසයෙන්ම පත්වේ.

## බුද්ධ පූජාව තැබීම නොකඩවා නිතිපතාම කළ යුතුද?


බුද්ධ පූජාව තමන්ට හැකි ආකාරයට හැකි පමණින් පිරිනැමිය යුත්තකි. පොසොන් දිනවල අපහසු නම් පොහෝ දිනවල හෝ එසේ කිරීම යෝග්‍ය වේ. වැදගත් වන්නේ පිළියෙළ කළ ආහාරේ නොඉදුල් අග්‍ර කොටස පූජා කිරීම පමණකි. දිනපතා බුද්ධ පූජාව තැබීමට නොහැකි වන්නේ නම් ඒ පිළිබඳව පසුතැවිලි වීමට අවශ්‍ය නොවේ. දිවා කාලයේ නිවසේ නොරැඳෙන්නන් නම් නිවසින් පිටවන උදේ කාලයේ පුවද බුද්ධ පූජාව පූජා කොට යෑම හොඳය. එසේද අපහසු නම් පූජා නොකිරීමෙන්ද වරදක් සිදු නොවේ. බුද්ධ පූජාව ලෙස පූජා කරන දේ ද වැදගත් නොවේ. පිරිසිදු සිතින් පිරිසිදුව තබන පැන් බඳුනක් පුවද සෑහේ. බුද්ධ පූජාව ලෙස තබන ඒ තුමන දෙයකින් තුමන ප්‍රමාණයක් පූජා කළද ඒ තුළින් හට ගන්නා චිත්ත පරම්පරාව අනුව කුසල් වැඩීම සිදුවේ.

## බුද්ධ පූජාවට තැබූ දේ ආහාරයට ගැනීම නුසුදුසුද?

මුලින් සාකච්ඡා කළ දාර්ශනික පදනම මත පිහිටුවා සංකේතාත්මක ක්‍රියාවක් ලෙස සිදුකරන බුද්ධ පූජාව පූජා කිරීම නිසා, ඉවුණ පසුව පවා එය බුද්ධ පූජාවක් වන්නේ නැත. නොයෙක් මැස්සන් ආදී සතුන්ගෙන් එම පූජාවන් අපිරිසිදු වීමට පෙර එය එතැනින් ඉවත් කොට සතෙකුගේ ආහාරය පිණිස දීමෙහි වරදක් නැත. එහෙත් එහිදී අරමුණ විය යුත්තේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණයන් උදෙසා බුද්ධ පූජාව පැවැත්වීමය. වෙනත් අරමුණක් මුල් කොටගෙන බුද්ධ පූජාව තැබීමෙන් ලැබෙන ආනිශංසයක් නැත.


මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ලඟාවෙති - අපණ්ණක ජාතකය"



# මොකක්ද මේ මතක වස්ත්‍ර පූජාව කියන්නේ?

ලොව පුරා විවරක පිළිගැනීම අනුව බුදුදහම ආගමකට වඩා දර්ශනයකට සමීප බුහුණි. හමුත් පොදු සමාජයේ පැවැත්මට හා ව්‍යසන විමට දර්ශනයකට වඩා ආගමකට පුළුල් හැකියාවක් තිබේ. ඒ අනුව මිනිසාගේ එදිනෙදා ජීවිතය සම්බන්ධ ආගමික චාරිත්‍ර ධර්ම රාශියක් ද බුදුදහම තුළ පවතී. කෙනෙකුගේ උපත, විවාහය සහ මරණය යන කරුණු තුන දේව නියමය අනුව සිදුවන බව ලොව දේවවාදී ආගම්වල පවතින පොදු විශ්වාසයකි. එහෙත් සර්ව බලධාරී දේව සංකල්පය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන බුදුදහම මිනිස් උපත විවාහය සහ මරණය දේව නියමයකට අනුව සිදුවන බව කෙසේ වත් නොපිළිගනී. හමුදු පුද්ගලයෙකුගේ උපතේදී විවාහයේ දී කෙසේ වෙතත් මරණයේ දී සිදුකළ යුතු ආගමික චාරිත්‍රාවලියක් පසු කාලීනව බුදුසමයට එක් වී තිබේ. එවා අතුරින් ප්‍රමුඛ වන්නේ පාංශුකූලය දීම යනුවෙන් හැඳින්වෙන මතක වස්ත්‍ර පූජාවය. පාංශුකූල යන්නෙහි අදහස පස් තැවරුණු යන්නය. අතීතයේ භික්ෂූන් වහන්සේ විවර සපයා ගත් එක් ක්‍රමයක් වූයේ අමු සොහොන්වල මළ සිරුරු ඔතා දමා දරදි රැගෙන එවා මනාව සෝදා පොහොසත්කම්න තත්ත්වයට පත් කොට එවා කත සිවුරු මැසීම. ඒ අනුව මිය ගිය අය වෙනුවෙන් අවමඟුල් උත්සවවලදී භික්ෂූන්ට පූජාව කෙරෙන විවර පාංශුකූල නොව මතක වස්ත්‍ර යනුවෙන් හඳුන්වීම වඩා සුදුසුය.



මෙම මතක වස්ත්‍ර චාරිත්‍රයේදී භික්ෂූන් වහන්සේට මතක වස්ත්‍ර පූජා කිරීම මගින් ලබා ගන්නා පින් මිය ගිය පුද්ගලයා වෙනුවෙන් අනුමෝදන් කෙරේ. පැන් වැඩීමෙන් එය සංකේතවත් වෙයි. පැන්වලින් සිදු කෙරෙන මෙබඳු සංකේත ක්‍රියා මිනිස් හදවත් තුළට තරයේම කිඳා බසියි. එමෙන්ම එමගින් මළ කාරියේ ශෝකයෙන්ට සුවිසල් මානසික අස්වැසුමක් ලැබේ. භික්ෂූන් වහන්සේලා පැන් වැඩීමේදී සජ්ඣායනා කරන ගාථාවේ අරුත.


"උස් තැනකට පතිත වන්නා වූ වැසි ජලය පහත් තැන කරා බැස යන්නේ යම් සේද එලෙසින් මේ මිනිස් ලොව සිටින ඥාති මිත්‍රාදීන් විසින් දෙන ලද පින මළගිය ඥාතියාට අත්වනු ඇත.

යම් සේ මහා ගංගාවෝ පිරී මහා සාගරය පුරවත් ද එලෙසම මෙයින් දෙන ලද පින මළගිය ඥාතියාට අත් වේ.

මෙහිදී මිය ගිය ඥාති ප්‍රේතයෝ (ඥාති ප්‍රේතජක කාල කතස්ස) මෙම පිං අනුමෝදන් වේවා යන ප්‍රාර්ථනය සිදුකරයි. ඒ සමඟම මිය ගිය අය ලැබිතාමිව උපත ලබා සිටි නම් පින් අනුමෝදන් වන බවත් එසේම පින් දෙන්නාට ද එම පින අයිති වන බවත් බුදුන්වහන්සේ දේශනාකොට තිබේ.

මේ අතර මරණයට පත්වූ තැනැත්තා ජීවත් කාලය තුළ කිසිදු කුසලයක් සිදුකොට නොමැති නම් හෝ ප්‍රේත ලෝකයෙහි ඉපදිය නැති නම් හෝ කිසියම් අකුසලයකින් ප්‍රේත ලෝකයෙහි උපත ලබා සිටිය නැත. එවන් පසුබිමක් පවතන් ඉන් මිදීමට පින් අනුමෝදන් කිරීම ඉමහත් ශක්තියක් වන බව පේතවත්ථු ආදී කෘතිවලින් අවධාරණය කෙරේ.

ධර්ම ගවේශක





# බුදු සිරිතේ දැක්වෙන නියම සල් ගස මෙන්න

අප මහබෝසතුන් වෙසක් මස පසළොස්වකදා දහවල ලුම්බිනී නුවර සල් උයනක සල් රුකක් යටදී මෙලොව එළිය දුටු බැවින් බෞද්ධයන්ට සල්ගස පූජනීය වෘක්ෂයකි. අද ලංකාවේ බහුලව පැතිර ඇති සල්ගස බෝසත් උපතට සම්බන්ධ නියම සල් ගසදැයි විවරණයක් මෙහි වේ.

බෝසත් උපතේදී මහාමායා දේවිය සල් ගසේ පිපී තිබූ මල් අත්තක් අල්ලා ගත් බව කියවෙයි. අද අප සල් යනුවෙන් හඳුන්වන ගසේ මල් ඵල හටගන්නේ කඳේය. සෘජුව වැඩෙන ගසෙහි කඳ අඩි තිහ හතළිහක් ඉහළට විහිදෙයි. එහි කෙළින් යන්නේ කුඩා අතුය. ඒවා කඳ පහතින් නොපිහිටන අතර කඳ මුදුනෙන් කෙටි දුරක් විහිදී යයි. මල් ඵල හටගන්නේ විශාල කඳේය. කුඩා ශාඛාවල මල් නොපිපෙන අතර ඒ කුඩා අතු හැමීමටද නොහැකිය.

මේ අනුව අද ලංකාවේ පැතිර ඇති සල් ගස හා බුද්ධ චරිතයේ කියවෙන සල් ගස එකක් නොවන බව පෙනී යයි. බුද්ධ චරිතය විස්තර වන සංස්කෘත ග්‍රන්ථයක් වූ "ලලිත විස්තරය" නම් කෘතිය අනුව බෝසත් උපත සිදුවූයේ වලක්ෂ වෘක්ෂයක් යටදීය. අභිනිෂ්ක්‍රමණ සූත්‍රය අනුව බෝසත් උපත සිදුවූයේ පලාස වෘක්ෂයක් යටදීය. ටිබෙට් බෞද්ධ මතය හා චීන දේශාටක හියුංසාං සඳහන් කර ඇති පරිදි බෝසත් උපත සිදුවූයේ අශෝක ගසක් යටදීය. සිංහල බෞද්ධ ග්‍රන්ථ අනුව සිම්බලී ගසක් යටදී බෝසතාණෝ උපත ලැබූහ. "සිම්බලී" යනු සංස්කෘතයේ "සල්මලී" යනුවෙන් එයි. සංස්කෘත සල්මලී යන්නෙහි අර්ථය ඉඹුල් ගස වුවත් මෙහිදී ඒ සල් අර්ථයෙන් යොදා ඇති බව කේ. ඩී. පී. වික්‍රමසිංහ "සම්බුදු සිරිත" ග්‍රන්ථයේදී කියයි.

තායිලන්තයේ බෞද්ධ පාලි ග්‍රන්ථ අනුව සල් වනයකදී බෝසත් උපත සිදුවිය. ලුම්බිණි නුවර තිබි පුරාවිද්‍යාඥයන් විසින් සල් වනයක් සොයාගෙන ඇති බැවින් සල් වනයකදී බෝසතුන් උපත ලැබූ ප්‍රවෘත්ත සනාථ වෙයි. එද ලුම්බිණි සල් උයන පිහිටි ප්‍රදේශය අද රුම්මින්ඩායි යනුවෙන් හැඳින්වෙයි. බෝසත් උපත සිදුවන විට සල් ගස මලින් බරව තිබූ බව ජාතක නිදාන පාලියේ සඳහන් වෙයි. බුදු පිරිනිවන වෙසක් පසළොස්වකදා මල්ලව රජ උයනේදී සිදුවූ බව ප්‍රකටය. එයත් ප්‍රකට මෙය අඹ උයනක් ලෙසයි. උපවත්තන සල් උයනේදී බුදු හිමි වැතිරුණු විට දෙපැත්තේ සල් ගස් දෙකක මල් හටගත් බව මහා පරිනිබ්බාන සූත්‍රය කියයි. (බෝසත් උපත, බුදුවීම හා පිරිනිවීම වෙසක් පෝයදාම සිදුවිදැයි සැක සහිත බව සංස්කෘතික දෙපාර්තමේන්තුව 1974 දී නිකුත් කළ වෙසක් කලාපයේ ලිපියකදී කියවෙයි. ජේතුව මැයි මස වන විට සල් මල් වාරයයි. බුදු පිරිනිවීම මැයි මස සිදුවී නම් කොලයේ මල් පිපීමක් අවශ්‍ය නැත. මේ අනුව ඔක්තෝබර්, නොවැම්බර් පමණ බුදු පිරිනිවන සිදුවිදැයි ඒ ලිපියේ කියවෙයි.) ලංකාවේදී මේ නිසා අතීතයේ සිටම සල් ගස පූජනීය වූ බව පෙනී යයි. අතීත සිංහල රජ උද්‍යානවල සල් ගස බහුල ලෙස වගා කර තිබූ බව හැඟෙයි. ප්‍රකට බෞද්ධ ආරණ්‍යයක් වූ සල්ගලට ඒ නම ලැබුණේ සල් ගස් නිසා බව පෙනෙයි.

අද ලංකාවේ වෙහෙර විහාර පන්සල් අතර වවා ඇති සල් ගස නියම සල් ගසදැයි සැක මතුවෙයි. එහි මල් පිපෙනුයේ කඳෙහිය. කඳෙන් විහිදෙන මුලින් ලියලා ලන අතු එහි නැත. කුඩා අතුවල මල් නොපිපෙයි. මේ ගැටලුව පිළිබඳව අදහස් තුනක් පහත පරිදිය.

01. දඹදිව බුද්ධගයාවේ කලක් වැඩ සිටි පූජ්‍ය තිල්වත්තේ සෝභිතානන්ද හිමි වෙත එවූ පොදුලික

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"

ශාස්ත්‍රීය ලිපියක දක්වන පරිදි ලංකාවේ අද පැතිර ඇති සල් ගස බුද්ධ චරිතයට සම්බන්ධ නියම සල් ගස නොවෙයි.

02. මහාචාර්ය සෙනරත් පරණවිතාන නියන පරිදි අද බෞද්ධයන්ගේ ගෞරවයට පාත්‍ර වන පන්සල් හා පූජනීය ස්ථානවල වවා ඇති සල් ගස නියම සල් ගස නොවේ. අද ලංකාවේ සල් ලෙස හැඳින්වෙන පැතිර ඇති පැළෑටිය දකුණු ඇමෙරිකාවෙන් ගෙනා කැනන්බෝල් නම් ශාකයයි.

නියම සල් ගස ලංකාවේ වැවීම දුෂ්කරය. පරණවිතාන මහතා පුරාවිද්‍යා කොමසාරිස්ව සිටියදී නියම සල් ගස පැරණි පූජනීය ස්ථානවල වවන ලෙස උපදෙස් දුන්නත් උද්භිද අධිකාරීන් කියා සිටියේ නියම සල් ගස ලංකාවේ වැවීම ඉතා දුෂ්කර බවය. ලංකාවේ ඉතා දුර්ලභ නියම සල් ගසක් පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඇත.

මේ අදහස වඩාත් විස්තර සහිතව පූජ්‍ය කිරිඇල්ලේ ඥානවිමල නාහිමි නම් දේශීය වෛද්‍ය ශබ්දකෝෂයේ පළමු මුද්‍රණයේ 516-518 පිටුවල ඒකා සටහන් සහිතව දක්වයි. මේ අනුව අද අපි සල් යනුවෙන් හඳුන්වන ගස 19 වන සියවසේදී දකුණු ඇමෙරිකාවෙන් ශ්‍රී ලංකාවට ගෙන ආ කැනන්බෝල් හෙවත් කාලතුවක්කු උණ්ඩ ගස වෙයි. එහි කඳෙහි විශාල ගෙඩි වල ගන්නා බැවින් කාලතුවක්කු උණ්ඩ ගස යනුවෙන් හැඳින්වෙයි.

නියම සල් ගසක් පේරාදෙණි උද්භිද උද්‍යානයේ ඇති අතර එය ඉන්දියාවෙන් ගෙනාවකි. බුද්ධ චරිතයට සම්බන්ධ නියම සල් ගස ඉන්දියාවේ වැඩෙයි. එම ගස මිටිය. මල් පිපෙන අතු අල්ලා ගත හැකි පරිදි ගස විහිදෙයි. මල් කුඩාය. කහ පාටය. මෙවැනි නියම සල් ගසක් දකින විට බෝසතුන් උපත ලැබුවේ මෙවැනි ගසක් යට යයි ඉබේම සිත පැනෙදෙයි.


පූජ්‍ය කිරිඇල්ලේ ඥානවිමල හිමි දේශීය වෛද්‍ය ශබ්දකෝෂයේ දක්වන පරිදි ලංකාවේ සල් ගස යටතේ පැළෑටි තුනක් විස්තර කරයි. හල් ගස, දනට සල් යයි වරදවා හඳුන්වන ගස හා සල්මලි ගසයි.

(අ) ඉන් හල් ගස උද්භිද විද්‍යානුකූලව වැටේරියාලැන්සිෆෝලියා ලෙස හැඳින්වෙයි. හල් ලංකාවට ආවේණිකය, හල් ගසේ කොළ තේක්ක කොළ වැනිය. මල් පොකුරු ලෙස පිපෙයි. ඉතා සුවඳයි. හල් ගසේ කුහීරා පොල් වැනි කුඩා ගෙඩි හට ගනී. එවා තිත්තය. හල් පොතු කහට රසය. පැණි උණු කරන විට කෙළිදිය රා වීම වැළැක්වීමට හල් පොතු එකතු කරයි. හල්දුම්මල විශේෂ ශාකයකි. දුම් ඇල්ලීමේදී හල්දුම්මල යොදා ගනී. හල්දුම්මලවලට දෙරණ තෙල් මිශ්‍ර කර වාර්නිෂ් සාදා ගත හැකිය.

(ආ) කිරිඇල්ලේ ඥානවිමල හිමි විස්තර කරන පරිදි අද ලංකාව පුරා සල් ගස ලෙස වැරදියට හඳුන්වන ගස ලංකාවට මුළුමනින්ම ආගන්තුක ශාකයකි. එය 1881 පමණ දකුණු ඇමෙරිකාවෙන් ලංකාවට ගෙනවුත් ඇත. කාලතුවක්කු උණ්ඩ වැනි විශාල ගෙඩි එල ගන්නා බැවින් ඒ නම ලැබී ඇත. සාදු කඳ උසය. ඉර උදව සමග ලොකු මල් පිපෙයි. මල් පරවූ විට දුගඳක් දනෙයි. ගෙඩියේ කටුව කහය. ඇට විශාලය. මදය දුගඳය. මේ ගස සල් පවුලට අයිති නැත. 1881 පමණ දකුණු ඇමෙරිකාවෙන් ගෙනා අපර රට පුරා පැතිර ඇත.

(ඇ) සල්මලි යනුවෙන් හඳුන්වන තුන්වැනි පැළෑටිය උද්භිද විද්‍යානුකූලව ෂොරියා රොබුස්ටා නම් වෙයි. ෂොරියා රොබුස්ටා ඉන්දියාවේ බහුලව වැඩෙයි. කඳ සුදු පාටය. කොළ අශ්ව කන් හා සමානය. අශ්ව කන් වැනි පත්‍ර ඇති නිසා එය සංස්කෘතයෙන් අශ්වකරණ කියයි. මුල්බිම ඉන්දියාවයි. මේ ගසක් පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඇත. මහාමායා දේවියට සෙවණ දුන්නේ මේ සල් ගසයි. ලංකාවට ආවේණික හල් පැළෑටියද මේ නියම සල් ගණයට වැටෙන බව දේශීය වෛද්‍ය ශබ්දකෝෂයෙහි කිරිඇල්ලේ ඥානවිමල හිමි කියයි. දනට රට පුරා පැතිර ඇති සල් ගස ලෙස වැරදියට හඳුන්වන සල් කුලයට අයිති නැති කැනන් බෝල් හෙවත් කාලතුවක්කු උණ්ඩ ගස 1881 පමණ දකුණු ඇමෙරිකාවෙන් ලංකාවට ගෙනා ලංකාවට මුළුමනින්ම ආගන්තුක ශාකයකි.

**ඉත්තෑපානේ එස්. කේ. ජයවර්ධන**



"සත්පුරුෂයන්ගේ උපදෙස් අනුව වැඩ කරන්නෝ දියුණුවට පත්වෙති - චුල්ලසෙට්ඨි ජාතකය"

# පංචශීල ප්‍රතිපදාවේ සදාතනික අගය



බෞද්ධයාගේ අවසාන අරමුණ වන විමුක්ති සුවය ලබාගැනීමේ පූර්ව ප්‍රතිපදාවේ ආරම්භයම ශීලයයි. බෞද්ධයාගේ ජීවන මාර්ගයේ චර්යා පද්ධතිය සකස් කර ගැනීමට පාදක වන්නේ බෞද්ධ ගිහියාගේ නිත්‍ය ශීලය වශයෙන් රැකිය යුතු යයි සම්මත පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා කිරීම බව පැහැදිලිය. ආර්ය මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීව යන අංගත්‍රය මෙමගින් සම්පූර්ණ වෙයි.

පංචශීල ප්‍රතිපදාව සමාජ සංවර්ධනයට, යහ පැවැත්මට උපකාරී වන සමාජ ධර්මතාවයකි. සමාජය යනු පුද්ගලයන්ගේ එකතුවකි. සමාජය හා පුද්ගලයා අන්‍යොන්‍ය වශයෙන්ද බැඳී පවතින සංස්ථා දෙකකි. පුද්ගල සංවර්ධනය සමාජ සංවර්ධනයටද පුද්ගල පරිහානිය සමාජගත පරිහානියක් ලෙසද හැඳින්විය හැකිය. සෑම පුද්ගලයකුගේම යුතුකම සෑම සත්ව වර්ගයාගේම ජීවත්වීමේ අයිතිය සුරකිමින් සාධු සම්මත ජීවිතයක් ගතකිරීමය. එහෙයින් පංචශීලය ගිහියා සතු නිත්‍ය ශීලය වශයෙන් හා බෞද්ධ ජීවන මාර්ගය වශයෙන්ද හැඳින්වීමට පුළුවන. පංචශීල ප්‍රතිපදාවෙහි මූලික අරමුණ පුද්ගලයාගේ කායික හා මානසික සුරක්ෂිතභාවය ඇතිවන් කිරීමයි. මෙම සුරක්ෂිතභාවය ද්විධාකාර වෙයි.

1. මනුෂ්‍ය ජීවිතය පිළිබඳ සුරක්ෂිතභාවය
2. භෞතික සම්පත් පිළිබඳ සුරක්ෂිතභාවය.

පංචශීල ප්‍රතිපදාවේ සදාතනික අගය විවරණය කිරීමේදී එම ප්‍රතිපදාවේ ගම්‍ය වන අංග පිළිබඳව විටින් විමර්ශනයක් කිරීම අවැසි වනු ඇත.

i. ප්‍රාණඝාතය (සතුන් මැරීමෙන් වැළකීම)
ii. අදත්තාදානය (සොරකම් කිරීමෙන් වැළකීම)
iii. කාමේසු මිච්ඡාචාරය (කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම)
iv. මුසාවාදය (බොරු කීමෙන් වැළකීම)
v. සුරාමේරය මජ්ජපමා දට්ඨානය (සුරා මත්ද්‍රව්‍ය පානයෙන් වැළකීම)

උක්ත පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා කිරීම, ඒ අනුව චර්යා පද්ධතිය සකස් කරගැනීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයටත් හේතුපාදක වන බව මනාව විමර්ශනය කර බැලීම ඥානාන්විත වනු ඇත.

I. සතුන් මැරීමෙන් වැළකීම (ප්‍රාණඝාතය)

සත්ව ඝාතනය හෙවත් ප්‍රාණ ඝාතය මුල්ම දුශ්චරිතය වෙයි. මේ ලෝකයේ වෙසෙන සෑම සත්වයකුටම ජීවත්වීමේ අයිතිය ඇත. එය පැහැර ගැනීම දුශ්චරිත අපරාධයකි. ජීවිතය පිළිබඳ සුරක්ෂිතභාවය නැති කිරීමකි. ප්‍රාණඝාතය පූර්ණත්වයට පත්වීමට කරුණු පහක් අවශ්‍ය වනු ඇත.

i. ප්‍රාණියෙකු වීම
ii. ප්‍රාණියෙකු බව දැනගැනීම
iii. මැරීමේ චේතනාව
iv. මැරීමට උපක්‍රමයක් යෙදීම
v. මරණයට පත්කිරීම

ඉහත කරුණු සම්පූර්ණ වීමෙන් ප්‍රාණඝාත දුශ්චරිතය සිදුවේ. මෙය විධිමත් ක්‍රියාවලියකි. එය අහම්බෙන් සිදුවන්නක් නොවේ. මිහිතලයේ වෙසෙන මනුෂ්‍යයා මෙන්ම සතා සිව්පාවාටද ජීවත් වීමේ අයිතිය ඇත. එහෙයින් සතුන් නොමැරීමෙන් ප්‍රකට වන්නේ ඔබටත්, අපටත් සමස්ත සත්ව වර්ගයාටත් නිදහසේ ජීවත්වීමේ අයිතිය සුරැකීමය.


"සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා - න හනෙය න ඝාතයේ"

අප අපගේ ප්‍රාණයට කැමතිය, අන් අයද ජීවත්වීමට ප්‍රියතාවයක් දක්වීම පොදු ධර්මතාවයකි. එසේ නම් සත්ව හිංසාවක් වන ප්‍රාණඝාතය පිළිකිරීම සාධු සම්මත ආචාර ධර්ම වනතෙක් මහා දුශ්චරිත අපරාධයක් බව සත්‍යයක් සේ පැහැදිලිය.

ii. සොරකම් කිරීමෙන් වැළකීම (අදත්තාදානය)

සොරකම හෙවත් අදත්තා දානය දෙවැනි දුශ්චරිතය ලෙස දක්වේ. මෙම ක්‍රියාව සම්පූර්ණ වීමට කරුණු පහක් අවශ්‍ය වනු ඇත.

i. අන්සතු වස්තුවක් වීම
ii. අන්සතු වස්තුවක් බව දැනගැනීම
iii. සොරකම් කිරීමේ චේතනාව



"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස වන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ අඳී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

iv. සොරකම සඳහා උපාය මාර්ග යෙදවීම
v. සොරකම් කිරීම

කිසියම් දේපළක් හෝ බඩු භාණ්ඩාදිය අයිතිකරු විසින් අත් නොහරින ලද, ඔහු විසින් සුරක්ෂිතව තබාගෙන ඇති. එමෙන්ම කායිකව හෝ වාචිකව ඒවගෙන යන්නැයි නොකියන ලද යම් ද්‍රව්‍යයක් අනුන්ට අයත් බව දැන දැනම තමා සතු කර ගන්නා වැරදි චේතනාවෙන් පැහැර ගැනීම, ඉවත් කිරීම, සොරකමක් ලෙස අර්ථ දැක්විය හැකිය. සමාජය තුළ පවතින දේපළ කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

i. පෞද්ගලික දේපළ
ii. පොදු දේපළ

බෞද්ධ ආර්ථික චින්තනය අනුව තම තමාගේ එදිනෙදා ජීවන රටාව සකස්කර ගත යුතුවේ. තමා රජයේ හෝ පෞද්ගලික ආයතනයක, කම්හලක, ගොවිබිමක කරන රැකියාවකින් උපයන වැටුප අනුව ජීවත්වීම පුද්ගල වගකීමකි. සොරකම් කිරීම, අයුතු ලෙස මිල මුදල්, භාණ්ඩ හා දේපළ ලබාගැනීම පුද්ගල වගකීම උල්ලංඝනය කිරීමකි. වත්මන් සමාජයේ ගෙවල් බිඳීම, මංපැහැරීම් සුලභව සිදුවන බව නිරීක්ෂණය වන කාරණයකි. මෙවැනි පරිසරයක පුද්ගලයා හැකිතාක් නීතියෙන් යුතුව ජීවත්වීමට සිදුවීමෙන් පෙනී යන්නේ දූෂිත සමාජ පද්ධතියක ලක්ෂණ ඒ තුළින් පරාවර්තනය වන බවයි. සොරකම අතර පළල් ලෙස විස්තර කිරීමට හැකියාව ඇත. ගෘහස්ථ, පාසල්, ආයතන, වෙළෙඳ කටයුතු ආශ්‍රයෙන්ද කණ්ඩායම් සොරකම් රටා වත්මන් සමාජයේ සිදුවනු ඇත. ගේ දොර බඩුභාණ්ඩ සොරකම් කිරීම, පොත්පත්, පෑන්, පැන්සල් සොරා ගැනීම, කූට ලේඛන සෑදීම, වංචා සහගත ගිණුම් කිරීම, කිරුම් මිනුම් කටයුතුවලදී වංචා කිරීම, ජලය, විදුලිය වංචා ලෙස ලබාගැනීම සමාජගත සොරකම් සහයට අයත් වේ.

එහෙයින් සොරකම තුළින් පුද්ගලයා පිළිකුලට, අවිශ්වාසයට, සමාජ විරෝධී ක්‍රියාවලට පත්වීම හා විවිධ දණ්ඩනවලට ලක්වීම සිදුවනු ඇත. එහෙයින් පුද්ගලයාටත්, සමාජයටත් මෙම දුශ්චරිතය කරන බලපෑමක් ඇති කරන බව පැහැදිලි වනු ඇත. තථාගතයන් වහන්සේ මෙය ප්‍රබල පාපකර්මයක් ලෙස විග්‍රහ කිරීමෙන් සවා පැහැදිලි වන්නේ මෙම දුශ්චරිත ක්‍රියාවේ බැරෑරුම්කමයි.

**iii. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම (කාමේසු මිච්ඡාචාරය)**

කාමයෙහි වරදවා හැසිරීම තුන්වැනි දුශ්චරිතය ලෙස දක්වා ඇත. පවුල් සංස්ථාවේ සම්මත ආචාර ධර්මවලට පටහැනිව ක්‍රියා කිරීම කාමයෙහි වරදවා හැසිරීම නම් වේ. කාම මිච්ඡාචාරය සම්පූර්ණවීම සඳහාද කරුණු සතරක් අවශ්‍ය වනු ඇත.

i. සේවනය නොකළ යුතු ස්ත්‍රියක් බව
ii. සේවන සිතුවිලි ඇතිවීම
iii. සේවනයේ යෙදීම
iv. එය ඉවසීම

පවුල් සංස්ථාව සංයමයෙන් හා මිහිරි ආකාරයෙන් පවත්වාගෙන යෑම සඳහා මෙම සමාජ සංස්ථාවට අදාළ භාර්යාවම ආරක්ෂා කිරීමට ස්වාමි ස්ත්‍රී දෙපාර්ශ්වයම බැඳී සිටිය යුතුය. එම සමාජ රාමුව තුළ නැත්නම් විවාහ දිවිය ගතකිරීම වෙනුවට වෙනත් පුද්ගල, ස්ත්‍රීන් සමග කාම සේවනයේ යෙදීම සමාජය අනුමත නොකරයි. සමාජ ඒකකයේ පදනම පවුල් ඒකකයයි. එහෙයින් කාම සේවනය වැරදි ලෙස සිදුකිරීම පවුල මෙන්ම සමාජයද දූෂණය වීමකි.

සිගාලෝවාද සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයෙහි ධාර්මික පැකඩීම කෙසේ සකස් විය යුතුදැයි පැහැදිලි කර ඇත. එහෙයින් මෙම අවිනීත ක්‍රියාව සමාජ පද්ධතියම විනාශය කරා ගමන් කරවන දුශ්චරිත කරුණක් බව අවබෝධ වනු ඇත.

**iv. බොරු කීමෙන් වැළකීම (මුසාවාදය)**

බොරු කීම හෙවත් මුසාවාදය සිව් වැනි දුශ්චරිතය ලෙස දක්විය හැකිය. සත්‍ය වූ කරුණක් අසත්‍ය ලෙසත්, අසත්‍ය දෙයක් සත්‍ය ලෙසත් ප්‍රකාශ කොට සමාජය මුළාවට පත් කිරීම බොරුවෙන් ගම්‍යමාන වෙයි. බොරුව සම්පූර්ණ වීමට පහත සඳහන් කරුණු සතර එකතු විය යුතුය.

i. බොරුවක් වීම
ii. බොරුව ප්‍රකාශ කිරීමේ සිත
iii. කායික-වාචික ප්‍රයෝග යොදා ගැනීම
iv. අසන්නා එය පිළිගැනීම

ජේතවන නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ බොරු කීම මහත් පාපකර්මයක් බව දේශනා කර වදාළේ බොරු කියන්නාට කිසිදු අපරාධයක් කළ හැකි බව අවධාරණය කරමිනි.

වර්තමාන සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමට ඇත්ත කතා කිරීම වැදගත් වේ. එය සමාජ යහපැවැත්මට උපකාරී වනු ඇත. ගෘහස්ථ පරිසරයට, ආයතනික කටයුතුවලදීද, රාජ්‍ය පාලන කටයුතුවලදීද සත්‍ය ප්‍රකාශ කිරීම සත්පුරුෂ ගුණධර්මයකි. බොරු කීම තවත් ඉදිරියට යමින්, කපටි වචන, හිස් වචන කේලාම් කීම දක්වා ප්‍රබල වී සමාජයක යහගුණය අකර්මණ්‍ය කිරීමටද හේතුසාධක වීමට ඉඩ ඇත. බොරු පොරොන්දු දීම, දුන් පොරොන්දු කඩ කිරීමද මුසාවාදයේම කොටසක් බව අමතක නොකළ යුතුය. සමාජ බන්ධුතාවය පළුදු වීම, සමාජ අපකීර්තියට ලක්වීම, අනුන චෝදනා එල්ලවීම, සත්‍ය අවබෝධයට බාධා ඇතිවීම මෙහි ආදීනව වශයෙන් පොදු කළ හැකිය.

**v. සුරා පානය (සුරාමේරය මජ්ජපමාද ට්ඨානා)**

පංචවිධ දුශ්චරිත අතර අවසන් අංගය සුරාමේරයයි. මේ සඳහාද කරුණු සතරක් සම්පූර්ණ විය යුතුවේ.




i. රහමෙර බීමිය යුතුවීම
ii. රහමෙර පානය කිරීමේ සිත
iii. ප්‍රයෝග යෙදීම
iv. පානය කිරීම

තථාගතයන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේදී මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පෙන්වා දී ඇත. ධනය විනාශ වීම, කලහකෝලාහල, රෝග පීඩා, නින්දා, අපහාස, ලැජ්ජා භය නැතිවීම, ප්‍රඥාව දුර්වලවීම එම ආදීනව වෙයි. ශීලයෙහි ප්‍රධාන අංග දෙකක් විද්‍යමාන වෙයි. යහපත් හැසිරීම්වල නිරතවීම හෙවත් පිරිය යුතු ගුණධර්ම පිරීම චාරිත්‍ර ශීලයයි. වැරදි හැසිරීම්වලින් බැහැරවීම හෙවත් ඉවත් කළ යුතු ධර්ම වැරීම නම්වූ වාරිත්‍ර ශීලය අනෙක් අංගයයි.

පංචශීල ප්‍රතිපත්තිය පුද්ගලයා හා සමාජය යාකරන යාන්ත්‍රණයක් වන බව මේ අනුව මනාව පෙනී යනු ඇත. පුද්ගල සංවර්ධනය හා සමාජ සංවර්ධනය ඇතිවන කිරීම සඳහා පංචශීල ප්‍රතිපදාව මහෝපකාරික විවිතාකමක් ඇති ආචාර විද්‍යාත්මක ප්‍රවේශයක් බව අභිමානයෙන් පිළිගත යුතු වන්නේය. ආදර්ශමත් බෞද්ධ සමාජයක්, බෞද්ධ රාජ්‍යයක් ගොඩනැගිය හැකි වන්නේ බෞද්ධයාගේ නිත්‍ය ශීලය වන පංචශීල ප්‍රතිපත්තිය පිළිපැදීමෙන් මෙලොව-පරලොව ජීවිත ආලෝකමත් කරගත හොත් පමණි.

ටී. කුලසිරි ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න



මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූපයකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා සිත්තමක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය බිරිඳ වන වාලටී බෙනරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම පෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)

**පසුගිය සතියේ 'පුදබිම' නිවැරදිව හඳුනාගත් ජයග්‍රාහී වාසනාවන්තයා**

**එච්.එම්. බිසෝ මැණිකේ**
අංක : 57 ඩී, ගොඩමුන්න,
තලාතුඔය.

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

**පසුගිය කලාපයේ (අප්‍රේල්) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර**
**ජය ශ්‍රී මහා බෝධිය**

## හාරිස්පත්තුව අරියවංශාලංකාර නාහිමි ත්‍රෛමාසික ගුණසමරු පින්කම ජුනි 21දා

**අභිපූජ්‍ය** හාරිස්පත්තුවේ අරියවංශාලංකාර නාහිමියන්ගේ ත්‍රෛමාසික ගුණසමරු පුණ්‍යෝත්සවය ජුනි මස 21 වැනි දින පෙරවරු 10.00 සිට සවස 4.00 දක්වා කටුගස්තොට බෞද්ධ බල මණ්ඩල ශාලාවේදී සිරි මහ බෝ පුදනම් හා අරියවංශාලංකාර ගුණ සමරු සමිතිය මගින් පැවැත්වීමට පිළිවෙළ යොද ඇත.

ජාතික, ශාසනික, සාමාජික, බෞද්ධ අධ්‍යාපනික ධර්ම සේවාවන් අනුශාසනා මගින් පවත්වා සම්බුද්ධ ශාසනය වෙනුවෙන් උදාර මෙහෙවරක් ඉටුකළ හාරිස්පත්තුව අරියවංශාලංකාර හිමි තෙරුන්ට පින් අනුමෝදන් කිරීම වස්, මෙදින ත්‍රෛනිකායික මහා සංඝරත්නය සියක් නමක් විශේෂයෙන් සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමෙන අතර මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා විසින් මෙදින විශේෂ ගුණසමරු දේශනයක්ද පවත්වනු ඇත.

**බොදු පුවත්**

## 89 වැනි පොසොන් පෙරහර පූජාපිටියේදී මෙවරත්

**පූජාපිටිය,** පලිපාන ශ්‍රී පූර්වාරාමයේ වාර්ෂික පොසොන් මහා පෙරහර ජුනි 12 වෙනිද විහාරාධිපති හාරිස්පත්තුව අස්ගිරි මහා පාර්ශ්වයේ හාරිස්පත්තුව අධිකරණ සංඝනායක මිනිවන්ගමුවේ ශ්‍රී රතනසාර නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් පැවැත්වේ.

විහාරකාර්ය සාධක සමිතිය හා පූජාපිටිය රජයේ සහ පොදු ආයතනවල සහය ඇතිව සංවිධානය වන පෙරහර මෙදින සවස 2.00ට මහවෙන් පිටත්ව වීදි සංචාරය කර සවස 6.00ට පමණ විහාර මළුවෙන් ගෙවදී.


**කේ. බණ්ඩාරනායක**

## ගල් විහාරයේ දළදා පොසොන් මහා පෙරහර ජුනි 13

**වෛතිහාසික** පොළොන්නරුව ගල් විහාරයේ දළදා පොසොන් මහා පෙරහර ජුනි 13 වෙනිද 42 වෙනි වතාවටත් පොළොන්නරුවේ ප්‍රධාන සංඝනායක, අස්ගිරි මහා විහාරීය ගෙදිගේ රාජමහා විහාරවාසී අස්ගිරිය මහා විහාර කාරක සභික ශාස්ත්‍රපති වේඩිරුවේ උපාලි නාහිමියන් සහ පොඹෙ ඇමැති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ අනුශාසකත්වයෙන් පැවැත්වේ.

මෙදින සවස හතට පමණ පොළොන්නරුව වටදාගේ දළදා මළුවෙන් ආරම්භ කරන පෙරහර සිරිත් ප්‍රකාර මාර්ග සංචාරයෙන් පසු ගෙවදී. දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයේ සම්බන්ධතාවයෙන් ප්‍රදේශයේ සියලුම ප්‍රාදේශීය කාර්යාල බැංකු, පුද්ගලික අංශ සහ පුලතිසිපුර ගොවි ජනතාවගේ සම්බන්ධතාවයෙන් මෙවරද පැවැත්වීමට කටයුතු යොද ඇති බව වේඩිරුවේ උපාලි නාහිමි සඳහන් කරයි.

[illegible]



# ඔබටත් දෙවියන්ගෙන්

## ඇරයුමක් ලැබෙන්නට පුළුවන්

එදිනෙදා ජීවිතයේදී අපට විවිධ අයුරින් ආරාධනා ලැබෙනු ඇත. ඒවා බොහෝ දුරට මනුෂ්‍ය ජීවිත ගත කිරීමේ දී අපට දක්නට පෙනෙන්නට තිබෙන මේ මනුෂ්‍ය ලෝකය තුළම ඒවාය. ඔබ ජීවිතය ගත කළඹ වෙඩින්, පාටි ආදියට invitation නොහොත් ආරාධනා ලැබෙනු ඇත. පැවිදි පක්ෂය ගත් කල්හි ධනට, බණට, පාංසුකූලයට පිරිතට මේ ආදී වශයෙන් ආරාධනා ලැබෙනු ඇත. මේ ආරාධනා එදිනෙද මිනුෂ්‍ය ජීවිතය හා යටවිම සබැඳි ක්‍රියාවලියෝය. ජීවිතය අවසන් කර එය අත් හැරීමේදී මාරයාගෙන්ද ආරාධනා ලැබෙනු ඇත. බුදු හිමිට විලෙස මාරයා ආරාධනා කළ අවස්ථා බුද්ධ චරිතය තුළ හමුවේ. තවද ශ්‍රාවක චරිත තුළද ඒ සම්බන්ධව කරුණු කාරණා හමුවූරු වේ.

අප ජීවත්ව සිටියදීම විළඟ භවය අපට උරුමව පවතී. අප කවද හෝ දිනක මේ ජීවිතය අත්හැර යා යුතුය. එවිට තවත් ආත්ම භවයක අප භව ගන්නවා ඇත. එය පුනර්භවය නමින් බුදු දහම තුළ විග්‍රහ වේ. නමුදු විළඟ ආත්ම භාවය කුමන අයුරින් සැකසෙන්නේද යන්න නිශ්චිතව කීමට අපහසුය. එය කුසලාකුසල කර්ම තුළින්ම තීරණය වේ. චුති චිත්තයට අනුවද විළඟ භවය තීරණය වීමට බොහෝ දුරට ඉඩ කඩ ඇත. කෙසේ නමුදු අප නිරතුරු සිදු කරන්නේ කුසල කර්ම නම් විළඟ භවය සුගතිගාමී වීමේ ප්‍රවණතාවය වැඩිය. එවිට විළඟ භවය ගැන බිය වීමට අවශ්‍ය නැත. නිරතුරු පින්දහම් කරන අයට ලැබෙන ආරාධනාද ඉතා වටිනේය. එවැනි උසස් ආරාධනාවක් ලැබීමට තරම් භාග්‍යවන්ත වූ උපාසකතුමෙක් පිළිබඳ ධම්ම පද විවරණය තුළින් පැහැදිලි වේ.

බුදුන් කල සැවැත් නුවර ධම්මික නමින් උපාසකතුමෙක් විසීය. මොහුට දියණිවරු 7 දෙනෙක් හා පුතණුවන් 7 දෙනෙක්ද වූහ. මෙතුම ඉතා ශ්‍රද්ධාවන්තය. කුණුරුවන්ට නිතර පූජාසත්කාර කරන්නේය. එමෙන් දියණියද දූ දරුවන් ඒ ආකාරයෙන්ම පිනට දහමට ලැදිය. මෙම ධම්මික උපාසකතුමා වයසට පැමිණි කළ පින් දහම් ස්වශක්තියෙන් කර ගැනීමට අපහසු විය. බොහෝ වයෝවෘද්ධව තරමක් රෝගතුරව මරණ මංචකයෙහි සිටින ධම්මික උපාසකතුමා දූදරුවන්ට තමහට සතිපට්ඨාන සූත්‍රය භික්ෂූන් ලවා ඇසීමට අවශ්‍ය බව මතක් කිරීමෙන් දූ දරුවෝ එම යුතුකම ඉටු කළහ. භික්ෂූන් වහන්සේලා 16 නමක් නිවසට වැඩම්මවා සතිපට්ඨාන සූත්‍රය ඇසීමට සැලැස්විය. එම දේශනාව ශ්‍රවණය කරන අවස්ථාවේදී ධම්මික උපාසකතුමා...

"ටිකක් නවතින්න... ටිකක් නවතින්න" යැයි ප්‍රකාශ කරන ලදී. පසුව භික්ෂූන් වහන්සේලා පිරිත් දේශනා කළා ප්‍රමාණවත්යැයි සිතා පිරිත නවතා විහාරයට වැඩම කළහ. පසුව මෙම පුවත බුදුරදුන්වද දන්වීය. එවිට බුදුරදුන් එම ප්‍රකාශය දෙවියන්ට කළ එකක් බවත් එසේ පැවසුවේ සියලු දිව්‍ය ලෝකවලින් ධම්මික උපාසක තුමාට "අපේ දිව්‍යලෝකයට එන්න..." "අපේ දිව්‍ය ලෝකයට එන්න" ආදී වශයෙන් ආරාධනා ලැබීමෙන් බවත් බුදුරදුන් පැහැදිලි කර දුන්හ.

ඒ අනුව පැහැදිලි වන්නේ පින් කිරීමේ දී ඇති ආනිශංසය නොවේද? එය සාංදෘෂ්ටික වශයෙන්ම විපාක දෙනු ඇත. ධම්මික උපාසකතුමාද ජීවත්ව සිටියදී නිරතුරුවම පින්දහම් සිදු කළේය. පවුල් ජීවිතයද යහපත්ව පවත්වාගෙන ගිය අතර තම යුතුකම් කොටසද නිසියාකාරව ඉටු කළේය. එහි ප්‍රතිඵලය වූයේ මිය යන්නට ආසන්න මොහොතේ දී දිව්‍ය ලෝකවලින් ආරාධනා ලැබීමය. සෝවාන් වී සිට ධම්මික උපාසකතුමා මිය පරලොව ගොස් තුසිත දිව්‍ය ලෝකයෙහි පහළ විය.



මෙම කතා පුවත පින් නොකරන , පිනෙහි වටිනාකම නොදන්න අයට හොඳ ආදර්ශමත් කතා පුවතකි. බුදු හිමි පින් කරන අයගේ වටිනාකම එම කතා පුවතටම අළලා තවත් විස්තර කර දෙන අයුරු ඉතා මනරම්ය.

**"ඉධ මෝදති පෙච්ච මෝදති**
**කත පුඤ්ඤෝ උභයත්ථ මෝදති**
**සෝ මෝදති සො පමෝදති**
**දිස්වා කම්ම විසුද්ධි මත්තනෝ"**

ධම්ම පදයේ පළමු වග්ගය වූ යමක වග්ගයේ 16 වෙනි ගාථාව තුළින් බුදු හිමි මෙම ගාථාව දේශනා කොට ඇත. එනම් "පින් කළ තැනැත්තා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි." ඔහ් තමාගේ ශුද්ධ කර්මය දැක සතුටු වෙයි. වැඩි වැඩියෙන් සතුටු වෙයි" මෙතනදී පින් යනුවෙන් දක්වා ඇත්තේ දස පුණ්‍ය ක්‍රියාය. එනම්,

**"දානං සීලංච භාවනා**
**පත්ති පත්තානු මෝදනා**
**වෙය්‍යා වච්ච පචායන්ති**
**දේශනා සුති දිට්ඨුජු"**

දාන , සීල , භාවනා , පින්දීම , පින් අනුමෝදන් වීම, වතාවත් කිරීම, පිදිය යුත්තන් පිදීම , බණ කීම, බණ ඇසීම, සම්මාදිට්ඨිය , මේ ආදී වශයෙන් පින්කම් 10ක් පිළිබඳ එම ගාථාව තුළින් බුදු හිමි පෙන්වා දී ඇත.

මෙම පින්කම් නිරන්තරයෙන් සිදු වුවද එවා නිසියාකාරව සිදු නොවනු ඇත. එයට හේතුව මනස ඒ සඳහා හරියාකාරව නොයෙදීමයි. මනස සියල්ලටම සම්බන්ධ වන බැවින් පින්කම් සඳහාද මනස ප්‍රමුඛස්ථානය වේ. සිතේ පවතින ලෝභ, දෝෂ, මෝහාදී කෙලෙස් ධර්ම යටපත් කොටගෙන ඒ වෙනුවට කුසල් සිතුවිලි ගොඩනගාගෙන පින්කම් කළ යුතුය. එවිට කුසලය මහත්ඵල මහානිශංස වේ. නමුදු අද කරන්නන් වාලේ පින්කම් කරනවා හැර එහි යථාර්ථය පිළිබඳ අවබෝධයක් නොමැත. එයින් එම කරන පින්කම්වල ප්‍රතිඵලය නිසියාකාරව නොලැබේ.

**"තුන් සිත පහදාගෙන දුන් දානය**
**උන් ගිය ගිය තැන ලැබේමයි නිධානය"**

යනුවෙන් ලෝවැඩ සඟරාවෙහිද සඳහන් වේ. එනම් තුන් සිත යනුවෙන් මනත් කළේ ඕනෑම ක්‍රියාවක් කිරීමේ දී කිරීමට පෙර , කරන අවස්ථාව හා කළාට පසු ආදී වශයෙන් සිතේ ක්‍රියාවලිය අවස්ථාත්‍රයක් ඔස්සේ විකාශනය වන බැවිනි. එම අවස්ථාත්‍රයම යහපත් නම්, පිරිසිදු නම්, එම ප්‍රතිඵලය ගැන කිව යුතු නැත.

මේ අනුව සලකා බැලීමේ දී අප නිතරම පින්කම් කළ යුතුය. එහි ප්‍රතිඵලය ඒ වේලාවේම නොලැබුණත් ආත්ම ගණනකදී හෝ ලැබෙනු ඇත. බුදු හිමි දේශනා කළේ පිනට කම්මැලි නොවන ලෙසයි. ඒ බව ලෝවැඩ සඟරාවේදී "තුම්වද කුසලට කම්මැලි වන්නේ" යනුවෙන් සඳහන් කොට ඇත. බුදු හිමි ධම්ම පදයේ පාප වග්ගයේ 03 වෙනි ගාථාව තුළින් දේශනා කළේ

**"පුඤ්ඤං චේ පුරිසෝ කයිරා**
**කයිරාථේනං පුනප්පුනං**
**තම්හි ඡන්දං කයිරාථ**
**සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ"**

පින් කරන මිනිසා එය නැවත නැවත කළ යුතුය. පින් කිරීමට ආශා කළ යුතුය. පින් රැස්වීම සැපයට හේතුවේ. බුද්ධ දේශනාව අනුව පින් කිරීම සැපයට හේතුවේ යන්න පැහැදිලි වේ. ඒ අනුව නොපමාව කුසල් දහම්හි නිරත විය යුතුය. කුසලය කළ යුතු වේලාවේ නොකරගෙන පසුවට පසුතැවිය නොවිය යුතුය. එසේ නම් දෙව් දේවතාවුන්ගේ පවා ආරාධනා ලැබිය හැකි කුසල් දහම්හි නිරන්තරයෙන්ම නිරත වී මෙලොව ජීවිතයත් පරලොව ජීවිතයත් සැපවත් කරගත යුතුය.

මාස්පොත ශ්‍රී ගංගාරාම විහාරවාසී
ගලගෙදර රතනවංශ හිමි